# වාර්ෂික වාර්තාව

# 2014

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,**

**නුගේගොඩ.**

# පටුන


- 2014 වාර්ෂික වාර්තාව ගරු ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම- ———— 03
- ගරු සභාපතිතුමාගේ පණිවුඩය ———— 04
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය- ———— 05
- අධ්‍යක්ෂ මණ්ඩලය- ———— 06
- ආයතනයේ සංවිධාන ව්‍යුහය- ———— 07
- පෙරවදන- ———— 08

**අංශභාර අධ්‍යක්ෂතුමන්ලාගේ වාර්තා**

- මෙහෙයුම් අංශය- ———— 11
- රක්ෂණ අංශය- ———— 19
    - ❖ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- ගොවි විශ්‍රාම වැටුප් අංශය- ———— 21
    - ❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා

  ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය- ———— 29
- අභ්‍යන්තර විගණන අංශය- ———— 34
- මුදල් අංශය ———— 37

**ගිණුම්**

- පෙර වසර පහක මූල්‍ය තොරතුරු 39
- සමස්ත යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන- ———— 43
- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 46
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 68
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 86

**විගණකාධිපති වාර්තා**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 102
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 114
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 126

**විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 136
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්රමය- ———— 142
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 148

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana
117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 3/1/13    ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ............    දිනය / திகதி / Date } 2016-01-05

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ලේකම්තුමනි,

**වාර්ෂික වාර්තාව - 2014**

2014 වසර තුල මණ්ඩලයේ පරිපාලන , මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය සහ වර්ෂය තුල සිදුකරන ලද සියළුම ක්‍රියාකාරකම් ඇතුලත් 2014 මණ්ඩලීය වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

සිඩනි ගජනායක.
සභාපති.
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

| | සභාපති / தலைவர் / Chairman | සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 448693 / 448694 | 438607 | 448691-2 / 438606 / 430058 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 449316 | 438607 | |

## ගරු සභාපතිතුමාගේ පණිවුඩය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්ෂණය හදුන්වාදී, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික පාඩුව අවම කර ගැනීම තුළින් දේශීය කෘෂිකර්මාන්තය මෙන්ම කෘෂිකාර්මිකයා නගාසිටුවීම සඳහා දශක හතරක කාලය තුල කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් ඉටුවී ඇති මෙහෙවර අති විශාල වේ.

2011 වර්ෂයේදී මෙම මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද ශක්‍යතා වාර්තාවක් අනුව සම්මත වී ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ආයතනයක් වෙත පවරා තිබූ ''කෙතට අරුණ - පොහොර දිරිය'' සහනාධාර පොහොර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වන්දි මුදල් ගෙවීමේ කටයුතු 2014/2015 මහ කන්නයේ සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරීමට රජය තීරණය කිරීම 2014 වර්ෂයේදී මණ්ඩලය ලද සුවිශේෂී අවස්ථාවක් වනු ඇත.

2014 අයවැය යෝජනා මගින් රුපියල් මිලියන 1000 ක් වෙන්වීමත් සමගම වසර දෙකක සිට අරමුදල ශූන්‍ය වීම නිසා අත්හිටුවීමට සිදුව තිබූ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු 2014 ජනවාරි මාසයේ සිට නැවත ආරම්භ කිරීමට හැකිවීමද 2014 වර්ෂයේදී මණ්ඩලය ලද විශේෂ ජයග්‍රහණයකි.

2014 වර්ෂයෙදී මණ්ඩලීය රක්ෂණ යෝජනා ක්‍රම මගින් මණ්ඩලය උපයාගෙන ඇති රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 119 ක් වන අතර, එය 2013 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 26 ක වැඩිවීමකි.

ඒ අනුව මණ්ඩලීය කාර්ය සඵලතාවයන්හි වර්ධනයක් ලඟාකර ගත හැකි වූ සාර්ථක වසරක් ලෙස 2014 වසර හැදින්විය හැක.

**සිඩ්නි ගජනායක**

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

### දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම

### මෙහෙවර

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2014

| | |
|---|---|
| ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය<br>ලේකම්,<br>ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය } සභාපති (2014.01.19 දක්වා)<br><br>නීතිඥ ආරියතිලක දහනායක මහතා } සභාපති (2014.01.20 සිට) | |
| 1- දමිතා රත්නායක මහත්මිය<br>අධ්‍යක්ෂ,<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය,<br>කොළඹ 01. | සාමාජික |
| 2- එම්. ඒ. එස්. වීරසිංහ මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>කොළඹ 07 | සාමාජික |
| 3- ටී.එච්.සී.එස්. පෙරේරා මහතා<br>අධ්‍යක්ෂ - සමාජ හා ආර්ථික සැලසුම්<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>පේරාදෙණිය | සාමාජික |
| 4- වෛද්‍ය බී. සිවයෝගනාදන්මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය. | සාමාජික |
| 5- ඒ. ලක්කතාස් මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>කොළඹ 10 | සාමාජික |
| 6- ඩබ්. ඒ. සී. තිසේරාමහතා<br>සහකාර සාමාන්‍යාධිකාරී<br>ලංකා බැංකුව | සාමාජික |
| 7- ආචාර්යඩී.එම්.එන්. දිසානායකමහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>බත්තරමුල්ල | සාමාජික |

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
## ආයතනික ව්‍යුහය



# පෙරවදන

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්‍ෂණ පනත මඟින් කෘෂිකාර්මික රක්‍ෂණය වෙනුවෙන්ම වූ එකම රාජ්‍ය රක්‍ෂණ ආයතනය වශයෙන් කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. ඒ අනුව අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්‍ෂණය හඳුන්වාදෙමින් හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික පාඩුව අවමකර ගැනීම සඳහා සහ එවන් අවස්ථාවකදී කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනයකර ගැනීම සඳහා පසුගිය දශක හතරක කාලය තුළ කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මඟින් ඉටුවී ඇති මෙහෙවර අතිවිශාල වේ.

2014 වර්ෂයේදීද මෙම මණ්ඩලය විසින් කෘෂිකාර්මික හා සාමාන්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රම රාශියක් දිවයින පුරා ක්‍රියාත්මකකර ඇති අතර, එම යෝජනා ක්‍රම මඟින් මෙම වර්ෂයේදී මණ්ඩලය උපයාගෙන ඇති රක්‍ෂණ වාරික ආදායම රුපියල් මිලියන 119 ක් වේ. එය 2013 වර්ෂයේදී උපයාගෙන ඇති රක්‍ෂණ වාරික ආදායමට සාපේක්‍ෂව රුපියල් මිලියන 26 ක වැඩිවීමකි.

<u>**වාර්ෂික වාරික ආදායම 2010 සිට 2014 දක්වා**</u>

| **යෝජනා ක්‍රමය** | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වගා රක්‍ෂණ යෝජනා ක්‍රම | **79.69** | **119.07** | **99.90** | **82.16** | **99.50** |
| පශු සම්පත් රක්‍ෂණ යෝජනා ක්‍රමය | **12.77** | **17.86** | **15.80** | **8.89** | **12.06** |
| ගබඩා හා කෘෂි උපකරණ රක්‍ෂණ යෝජනා ක්‍රම | **3.40** | **5.88** | **6.50** | **1.53** | **0.25** |
| සුවසෙත හා හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රම | **9.62** | **14.23** | **2.50** | **0.74** | **7.74** |
| **එකතුව** (රු මිලියන) | 105.48 | 157.04 | 124.70 | 93.32 | 119.54 |



ගොවි විශ්‍රාම වැටුප් නැවත ගෙවීම ආරම්භ කිරීමට හැකිවීමත්, “කෙතට අරුණ-පොහොර දිරිය” රක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව මණ්ඩලයට හිමිවීමත් 2014 වර්ෂයේ මණ්ඩලයේ කාර්යය සඵලතා අතර ප්‍රමුඛතම ස්ථානයක් හිමිකරගෙන ඇත. මණ්ඩලයේ නාමය ජනතාව අතර වඩාත් ප්‍රචලිතවීමට හේතුවූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල් ශූන්‍යවීම නිසා වසර දෙකක කාලයක සිට අත්හිටුවා තිබූ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු 2014 වර්ෂයේදී නැවත ආරම්භ කිරීමට හැකිවීම මෙම වර්ෂයේදී මණ්ඩලය ලද සුවිශේෂී ජයග්‍රහනයකි. 2014 අයවැය යෝජනා මඟින් ඒ සඳහා රුපියල් මිලියන 1000 ක් වෙන්වීමත් සමඟ 2014 ජනවාරි මාසයේ සිට සියළුම විශ්‍රාම වැටුප් ලාභීන් වෙත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම නැවත ආරම්භ කරන ලදී. ගොවි ජනතාවට කෙරෙන විශේෂ උපහාරයක් වශයෙන් වයස අවුරුදු 63 ට වැඩි විශ්‍රාම වැටුප් ලාභීන් සඳහා අවම මාසික විශ්‍රාම වැටුප රු: 1,250/= සිට උපරිමය රු: 5,000/= දක්වා වැඩිකර ගෙවීමටද කටයුතු කර ඇත. ගොවි විශ්‍රාම වැටුප් නැවත ගෙවීම ආරම්භ කිරීමේ ජාතික උත්සවය 2014.01.28 දින හම්බන්තොට මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති අතර, ගොවි ජනතාවගේ, දේශපාලන අධිකාරියේ හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින් ගොවි ජනතාවගේ ප්‍රසාදය නැවත දිනා ගැනීමටද 2014 වර්ෂයේදී මණ්ඩලයට හැකියාව ලැබී ඇත.

එමෙන්ම සහනාධාර යටතේ පොහොර ලබාගන්නා ගොවීන් වෙනුවෙන් වගා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා වාර්තාවක් 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් පිළියෙල කර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නමුදු, 2012 අයවැය යෝජනා මඟින් අනුමතවූ නව රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය භාරය මණ්ඩලය වෙත හිමි නොවීය. එසේ වුවද එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ ආයතනයට මුහුණපෑමට සිදුවූ ගැටළු පිළිබඳව හා දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුරෝගාමී රක්ෂණ ආයතනය වශයෙන් මණ්ඩලය සතු පළපුරුද්ද හා හැකියාව සළකා බලා එම “කෙතට අරුණ-පොහොර දිරිය” රක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ පූර්ණ වගකීම 2014/2015 මහ කන්නයේ සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරීමට රජය තීරණයකර ඇති අතර, එයද 2014 වර්ෂයේදී මණ්ඩලය ලද සුවිශේෂී අවස්ථාවක් වශයෙන් සඳහන් කළ හැක.

මණ්ඩලයේ වාර්ෂික රක්ෂණ වාරික ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් උපයාගනු ලබන වගා රක්ෂණ යෝජනා ක්‍රම මඟින් 2014 වර්ෂයේදීද වැඩි ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇති අතර, එය 2013 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 26 ක වැඩිවීමකි. විශේෂයෙන්ම ගොවි විශ්‍රාම වැටුප් නැවත ගෙවීම ආරම්භ කිරීමත් සමඟ මණ්ඩලය කෙරෙහි ගොවි ජනතාවගේ තිබූ විශ්වාසය නැවත තහවුරුවීමත් සහ 2014-08-01 සිට 2014-12-31 දින දක්වා විශේෂ දිරිදීමනා ගෙවීමේ ක්‍රමවේදයක් සහිතව ක්‍රියාත්මක කළ සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම සඳහා දායකයන් බඳවා ගැනීමේ විශේෂ ප්‍රවර්ධන වැඩසටහනත් නිසා එම යෝජනා ක්‍රම මගින් 2013 වර්ෂයට වඩා රුපියල් මිලියන 6 ක වාර්ෂික ආදායමක් 2014 වර්ෂයේදී උපයා ගැනීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කළ වාරික සංශෝධන හා විශේෂ ප්‍රවර්ධන වැඩ සටහන්වල උපරිම ප්‍රතිඵල 2014 වර්ෂයේදී ළඟාකර ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව 2013 වර්ෂයේදී රුපියල් මිලියන 7 ක්ව තිබූ පශු සම්පත් රක්ෂණ වාරික ආදායම 2014 වර්ෂයේදී රුපියල් මිලියන 12 දක්වා වර්ධනයවී ඇත.

අධික නියඟය හා ගංවතුර හේතුවෙන් 2014 වර්ෂයේදීද ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල වගාවන්ට විශාල වශයෙන් හානිවූ අතර, වන්දි ගණනය කිරීමේදී මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් 2014 වසරේදීද රක්ෂිත ගොවීන්ගේ වගා හානි වෙනුවෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීමට මණ්ඩලය කටයුතුකර ඇත.

2014 වර්ෂයේ මාස කීපයක් පුරා පැවති නියඟය හේතුවෙන් නියමිත කාලසීමාව තුළ වගා කටයුතු ක්‍රියාත්මක නොවීමත්, ජල පහසුකම් නොමැතිවීම හේතුවෙන් බොහෝ කුඹුරුවල වගා කටයුතු සිදුනොවීමත් මෙම වර්ෂයට නියමිත මුල්‍ය ඉලක්කය සපුරා ගැනීමේදී අහිතකර ලෙස බලපා ඇත. එමෙන්ම ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු නැවත ආරම්භ කිරීමත් සමඟ එම විශ්‍රාම වැටුප් ගොවි ජනතාව වෙත කඩිනමින් ලබාදීම සඳහා ප්‍රධාන කාර්යාලයේ මෙන්ම දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත සමස්ථ කාර්යය මණ්ඩලයටද, 2014 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ වැඩි කාලයක් ගතකිරීමට සිදුවීමද, අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමට තිබූ අවස්ථා අඩුවීමටද හේතුවී ඇත.

2014 වර්ෂයේදී මණ්ඩලයේ සේවයට අළුතින් නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන ඇති අතර, නිලධාරින් හය දෙනෙකු විශ්‍රාම ලබා ඇත. නියමිත සැලැස්ම අනුව අනුමත කාර්යය මණ්ඩලය 421 ක් වුවද මේවනවිට කාර්යය මණ්ඩලයේ සේවක පිරිස 296 ක් වේ. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 125 කි.

මණ්ඩලීය කාර්යය භාරය තුළ සුවිශේෂී වසරක්වූ 2014 වර්ෂයේදී මණ්ඩලය සිදුකළ ක්‍රියාකාරකම්හි කාර්යය සඵලතා මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

# මෙහෙයුම් අංශය

## මෙහෙයුම් අංශය

කෘෂිකාර්මික ආර්ථිකයක් හිමි සහ කෘෂිකාර්මික ශ්‍රම බලකාය 30% ඉක්මවන රටක් ලෙස කෘෂිකාර්මිකයා මුහුණපාන නිෂ්පාදන අවදානම මෙන්ම කෘෂි නිෂ්පාදන වලට නිසි වටිනාකමක් හිමි කර දීම සඳහා කෘෂිකාර්මික අවදානම් කළමනාකරණයේදී රජය යොදා ගන්නා ප්‍රධාන විකල්පයක් වනුයේ කෘෂිකාර්මික රක්ෂණයයි. ඒ සම්බන්ධ සියලු කටයුතු ක්‍රියාත්මක කරමින් දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා ලෙස කෘෂිකාර්මිකයින්ට ස්ථාවරත්වයක් ලබා දීම හා එමගින් කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමෙහිලා විශාල කාර්යභාරයක් ඉටු කරන එකම රාජ්‍ය කෘෂි රක්ෂණ ආයතනය කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයයි.

මෙම මණ්ඩලයේ සේවාවන් ගොවි ජනතාව අතර ව්‍යාප්ත කිරීමේදී වැදගත්ම කාර්යභාරයක් ඉටු කරන අංශය ලෙස මෙහෙයුම් අංශය හැඳින්විය හැකිය. ආයතනය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුලත් සංයුක්ත සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්ම ඇතුලුව, සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීපව්‍යාප්තව පැතිරී ඇති මණ්ඩලීය සියළු දිස්ත්‍රික් මෙහෙයවීම සහ පාලනය, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මතුවන සියලු අවශ්‍යතා පූරණය කර ගැනීම ආදී සුවිශාල කාර්යභාරයක් සිදු කරනුයේ මෙහෙයුම් අංශය මගිනි.

කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයේ රක්‍ෂණ සේවා සපයන එකම රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණුකර ගනිමින්, 201 4 වර්ෂයේදීද යෝජනාක්‍රම රාශියක් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත. එමඟින් 2014 වර්ෂයේදී මණ්ඩලය උපයා ඇති රක්‍ෂණ වාරික ආදායම රුපියල් මිලියන 119 ක් විය.එය පසුගිය වර්ෂයේ ආදායම වන රුපියල් මිලියන 93ට සාපේක්‍ෂව මිලියන 26ක වර්ධනයකි. මෙම ආදායම වර්ධනය කර ගැනීමේදී මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු පිණිස කෘෂිකාර්මික රක්‍ෂණයට ප්‍රමුඛත්වය ලබා දෙමින් පහත සඳහන් පරිදි රක්‍ෂණ යෝජනා ක්‍රම රාශියක් 2014 වර්ෂය තුලදී ද අප විසින් ක්‍රියාත්මක කරන ලදි.

## ක්‍රියාත්මක කරන ලද රක්ෂණ යෝජනා ක්‍රම

1. වගා රක්ෂණ යෝජනා ක්‍රම
    - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - බඩඉරිගු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - අතිරේක බෝග වගා (මුං, රටකජු, සෝයා, උඳු) රක්ෂණ යෝජනා ක්රමය
    - ලොකුළූණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - වැවිලි භෝග (තේ) වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - පොල් වගා රක්ෂණ යෝජනාක්‍රමය.
    - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - ඉගුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය.
    - පලතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය.

2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
3. ට්‍රැක්ටර් ඇතුළු කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
4. පශු රක්ෂණ යෝජනා ක්‍රමය
    - එළුරක්ෂණ යෝජනා ක්‍රමය
    - ගවරක්ෂණ යෝජනා ක්‍රමය
5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය.
6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය.

මෙම රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, එම යෝජනා ක්‍රම ගොවීන් අතර තව තවත් ප්‍රචලිත කිරීම හා ව්‍යාප්ත කිරීම වෙනුවෙන් බොහෝ වැඩසටහන් මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදි.

## අලෙවිකරණ හා ප්‍රචාරක කටයුතු

1. වසර දෙකක කාලයක් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු අත්හිටු වීමට සිදු වීම නිසා මණ්ඩලය කෙරෙහි අප්‍රසාදයට පත්ව සිටි ගොවි ජනතාවගේ විශ්වාසය නැවත දිනා ගැනීම උදෙසා 2014 ජනවාරි මාසයේ සිට විශ්‍රාම වැටුප් ගෙවීම නැවත ආරම්භ වීමත් සමඟ ගොවි විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ප්‍රචාරක රැස්වීම් රාශියක් දිවයින පුරා පවත්වන ලදී. 2014/01/18 දින හම්බන්තොට මාගම් රුහුණු පුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් සපැමිණි විශාල ගොවිජනතාවකගේ සහභාගිත්වයෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ සමාරම්භක උත්සවය පවත්වන ලද අතර, අනතුරුව උතුරු නැගෙනහිර පළාත්ද ඇතුළුව දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රධාන උත්සව 43 ක් හා ප්‍රදේශීය මට්ටමේ උත්සව විශාල සංඛ්‍යාවක් මෙහෙයුම් අංශයේ මෙහෙය වීමෙන් හා දිස්ත්‍රික් කාර්යය මණ්ඩල වල සංවිධානයෙන් පවත්වා ඇත. අදාල දිස්ත්‍රික්ක වල දේශපාලන අධිකාරීයේ හා නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම උත්සව වලදී එවකට විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලබා සිටි 128,600 ක් වූ සියළුම විශ්‍රාම වැටුප් ලාභීන් වෙත විශ්‍රාම වැටුප් චෙක්පත් ප්‍රදානය කරන ලද අතර, එහිදී මණ්ඩලීය යෝජනා ක්‍රම පිළිබඳව භාහිර නිලධාරීන්ගේ හා ගොවි ජනතාවගේ ප්‍රසාදය හා විශ්වාසය නැවත තහවරු කර ගැනීමට හැකි විය.

2. අනුරාධපුර ජය ශ්‍රීමහා බෝධීන් වහන්සේ අභියස සාම්ප්‍රදායිකව සිදු කෙරෙන ජාතික අළුත් සහල් මංගල්‍යය 2014/04/02 දින පැවති අතර, එහිදී පිරිත් මණ්ඩපය ඉදි කිරීම, ශබ්ද විකාශන පහසුකම් සැපයීම, පිරිත් දේශණයට ස්වාමීන් වහන්සේලා වැඩම වීම, චතුමධුර පූජා කිරීම, හා එදින පහන් වන තුරු උන් වහන්සේලාගේ සියළු ආවතේව කටයුතු ඉටු කිරීම මණ්ඩලයේ අනුග්‍රහයෙන් හා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී. ඊට අමතරව පොලොන්නරුව දිස්ත්‍රික් අළුත් සහල් මංගල්‍යය වත්මන් ජනාධිපති අතිගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. 2014/04/06 දින ඓතිහාසික ගල්විහාරයේදී පැවති අතර, ඒ සඳහාද මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

3. 2013/14 මහ කන්නයේ වගා හානි වූ ගොවීන් වෙත වන්දි මුදල් ප්‍රදානය කිරීමේ උත්සව දෙකක් ගරු මැති ඇමතිතුමාන්ලාගේ ප්‍රධානත්වයෙන් 2014/06/07 දින අනුරාධපුරයේදී හා 2014/06/22 දින මඩකළපුවේදී පැවැත් විය. ඊට අමතරව ගොවි ජනතාව වෙත වඩාත් සමීප වීමේ අරමුණින් 2013/14 මහ කන්නයේ සහ 2014 යල කන්නයේ වගා රක්ෂණ වන්දි ප්‍රදානය කිරීමේ ප්‍රාදේශිය වැඩ සටහන් මණ්ඩලයේ සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් 2014/06/23 දින අම්පාර දිස්ත්‍රික්කයේ පානම විහාරස්ථානයේදීද 2014/07/09 දින මන්නාරම දිස්ත්‍රික්කයේ පරප්පු කඩන්දාන් ප්‍රජා ශාලාවේදී සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ

පුනරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීද 2014/07/10 දින යාපනය දිස්ත්‍රික්කයේ වාවකච්චේරිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දීද 2014 /07/14 දින මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව සංස්කෘතික මධ්‍යස්ථානයේදී හා මලිගාවිල නියදැල්ල මහ විද්‍යාලයේදීද 2014/09/11 දින මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී හා වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියා දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලයේදීද 2014/12/09 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරවිල සමගිපුර මහ විද්‍යාලයේදීද පවත්වන ලදී.

4. 2014 වර්ෂයේදී දිවයිනේ ප්‍රධානතම කෘෂිකාර්මික දිස්ත්‍රික්ක වල පැවති දැඩි නියඟයෙන් පීඩා විඳි බොහෝ ජනතාව මෙම මණ්ඩලයේ ප්‍රධානතම සේවා දායකයින් වූ බැවින් ඔවුන් වෙත කෙරෙන ප්‍රජා සත්කාරයක් වශයෙන් මණ්ඩලයෙන් ලද රු. 200,000/- ක මූල්‍ය අනුග්‍රහයෙන් හා මණ්ඩලීය නිලධාරින්ගේ පරිත්‍යාගශීලී දායකත්වයෙන්, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දිඹුලාන මහවැලි ඒකක කොට්ඨාසයේ ගොවි පවුල් 334 ක් වෙත රු. 1,000/-ක වටිනාකමින් යුත් වියළි ආහාර මල්ලක් බැගින් ප්‍රදානය කිරීම 2014/09/10 දින මණ්ඩලයේ සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් සිදු කෙරිණි.

5. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව පවත්වනු ලබන “ ජාතික ගොවි සතිය ” ප්‍රදර්ශනය 2014-09-09 සිට 14 දින දක්වා මාතර දිස්ත්‍රික්කයේ, තෙලිජ්ජවිල ගොවි පුහුණු මධ්‍යස්ථානයේදී පැවති අතර, එහිදී මණ්ඩලයේ ක්‍රියාකාරකම් හා සේවාවන් විදහා දැක්වෙන ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමටත්, අත්පත්‍රිකා මඟින් මණ්ඩලීය සේවාවන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත් කටයුතු කර ඇත.

6. අපනයන භෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ලද සේවාව අගය කිරීම හා දිරිගැන්වීම සඳහා 2013 වර්ෂයේදී වැඩිම වගා බිම් ප්‍රමාණයක් රක්ෂණය සඳහා යොමුකරන ලද මාතර දිස්ත්‍රික්කයේ නිලධාරීන්ගෙන් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන හිමිකරගත් නිලධාරීන් වෙත පිළිවෙලින් රු: 5,000/=, 3,000/= හා 2,000/= බැගින් මුල්‍ය ත්‍යාග හා සේවය ඇගයීමේ සහතිකපත් පිරිනැමීම මාතර පැවති ගොවි සතිය උත්සවයේදී සිදුකරන ලදී.

7. මණ්ඩලයේ සේවාවන් ව්‍යාප්ත කිරීමේදී බාහිර ආයතනවල නිලධාරීන්ගේ හා විශේෂයෙන්ම වගා රක්ෂණ කටයුතුවලදී රාජ්‍ය බැංකු නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය වර්ධනයකර ගැනීමේ වැඩ සටහන් යටතේ මහජන බැංකුවේ පළාත් සහ දිස්ත්‍රික් භාර විධායක නිලධාරීන්ගේ සහ ශාඛා කළමනාකාරවරුන් ඇතුළු අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2014-10-10 දින බදුල්ලේදීද, 2014-11-08 දින අනුරාධපුරයේ කලාවැවදී ද, 2014/12/12 දින පොලොන්නරුවේදී ද සුහද හමු පවත්වන ලද අතර, මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ

සංවිධානයෙන් 2014-09-06 දින දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ක්‍රිකට් කණ්ඩායම අතර සුහද ක්‍රිකට් තරඟයක් මහනුවර දංගොල්ල ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

8. දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන විශේෂ ප්‍රචාරක හා ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා අවශ්‍යවන පෝස්ටර්, බැනර් හා අත්පත්‍රිකා දිස්ත්‍රික් කාර්යාල මඟින් පිළියෙලකර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරදී ඇති අතර, කළුතර, කෑගල්ල, පොලොන්නරුව ඇතුළු දිස්ත්‍රික්ක කීපයකින් ලැබුණු ඉල්ලීම් අනුව අදාළ අවශ්‍යතා මෙහෙයුම් අංශය මඟින් සපයාදීමටද කටයුතු කර ඇත.

9. පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් යටතේ 2014/10/14 දින කෑගල්ල දිස්ත්‍රික්කයේ මෝරගම්මන වෙල්යායේදී පැවති උත්සවයේදී මණ්ඩලීය ප්‍රචාරක බැනර් ප්‍රදර්ශනය කිරීම හා අත්පත්‍රිකා බෙදාදීමත්, මණ්ඩලීය යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ගොවි ජනතාව වෙත ප්‍රදානය කිරීමටත් කටයුතු කර ඇත. මෙම වැඩ සටහනට සමගාමීව බ්‍රවුන්ස් සමාගම සමඟ ඒකාබද්ධව ට්‍රැක්ටර් රක්‍ෂණය කිරීමේ වැඩ සටහනක්ද ක්‍රියාත්මක විය.

10. මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධනයට උරදෙන ආකාරයේ දිරිදීමනා ක්‍රමයක් සකස් කිරීමේ හා ගොවි විශ්‍රාම වැටුප් දායකයින්ගේ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමේ වැඩ මුළුවක් 2014-10-14 සහ 15 දිනවලදී රත්නපුර කිරිඇල්ලේ, විජය රිසෝට් හෝටලයේදී ද 2015 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කිරීම, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ආයතනික කාර්යය පටිපාටිය සකස් කිරීම පිළිබඳ වැඩ මුළුවක් 2014-09-15 සහ 16 දිනවලදී පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේදීද ප්‍රධාන කාර්යාලීය විධායක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කර පැවැත්විය.

11. මණ්ඩලීය යෝජනා ක්‍රම පිළිබඳව ග්‍රාමීය ගොවි ජනතාවගේ අවධානය යොමුකර ගැනීමේ ආකර්ශණීය ප්‍රචාරක මාධ්‍යයක් වශයෙන් ජනප්‍රිය රංගන ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් වීදි නාට්‍ය සංදර්ශන 18 ක් 2014 දෙසැම්බර් මාසයේදී හම්බන්තොට හා මාතර දිස්ත්රික්කවල පවත්වන ලදී. ඒ සඳහා වැය වූ රු: 200,000/= ක වියදම සඳහා අනුග්‍රහය ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව විසින් ලබාදෙන ලදී.

12. 2014/11/02 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධානයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගන වෙල්යායේදී පැවති 2014/15 මහ කන්නයේ ජාතික වප් මඟුල් උත්සවයට සහභාගීවූ ගරු මැතිඇමතිතුමන්ලා රාජ්‍ය නිලධාරීන් හා ගොවි ජනතාවට ඇඳීම සඳහා මණ්ඩලයේ නාමය මුද්‍රිත බැනියම් 50 ක් මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රහයෙන් ලබාදී ඇත.

13. 2013 අගෝස්තු මාසයේ සිට 2014 ජනවාරි 31 දින දක්වා දීප ව්‍යාප්තව ක්‍රියාත්මකවූ පශු සම්පත් රක්‍ෂණ අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන තුළදී නියමිත ඉලක්කය සපුරාලන ලද මණ්ඩලීය ක්‍ෂේත්‍ර/සංවර්ධන නිලධාරීන් 16 දෙනෙකු වෙත සේවා ඇගයීමේ සහතික පත්‍ද, පිළිවෙලින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන හිමිකරගත් කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේ සංවර්ධන නිලධාරී ඒ.ජී. සිරිසෝම මහතා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලයේ ක්‍ෂේත්‍ර නිලධාරී එස්.ඒ. ජිහාන්කීර් මහතා සහ තඹුත්තේගම කාර්යාලයේ ක්‍ෂේත්‍ර නිලධාරී ඊ.එම්. විමලරත්න මහතා වෙත වටිනා රූපවාහිනී යන්ත්‍රය බැගින්ද ප්‍රදානය කරන ලද අතර, පිළිවෙලින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන හිමිකරගත් කෑගල්ල, කුරුණෑගල හා මහනුවර දිස්ත්‍රික් කාර්යාලවල කාර්යය මණ්ඩලය වෙත රු: 10,000/=, රු: 8,000/= හා රු: 6,000/= බැගින් මුල්‍ය ත්‍යාග පිරිනැමීම 2014-11-21 දින මහරගම ශ්‍රී ලංකා යූත් ශ්‍රවනාගාරයේ පැවති නිලධාරී රැස්වීමේදී සිදු කරන ලදී.

14. සුවසෙත හා හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමේ විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩ සටහනක් 2014-08-01 දින සිට 2014-12-31 දින දක්වා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී මෙම යෝජනා ක්‍රම දෙක යටතේ 2013 වර්ෂයට වඩා රුපියල් මිලියන 07 ක වාර්ෂික ආදායමක්, 2014 වර්ෂයේදී උපයා ගැනීමට හැකිවිය.

15. වාර්ෂික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ හා ඉදිරි ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡා තුනක් ප්‍රධාන කෘෂිකාර්මික, අර්ධ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන දිස්ත්‍රික්ක වශයෙන් ගෙන එක් එක් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්‍ෂවරුන්ගේ හා ජ්‍යෙෂ්ඨතම සංවර්ධන/ක්‍ෂේත්‍ර නිලධාරින්ගේ සහභාගීත්වයෙන්2014/09/15, 24, 25 යන දිනවලදී ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.

16. සහනාධාර පොහොර ලබාගන්නා ගොවීන් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන "කෙතට අරුණ-පොහොර දිරිය" වැඩ සටහන යටතේ රක්‍ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මණ්ඩලයේ කාර්යය භාරය පිළිබඳව හා ගොවි විශ්‍රාම වැටුප් දායක තොරතුරු රැස්කිරීමේ වැඩ සටහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ මුළුවක් දිස්ත්‍රික් භාර සියළුම නියෝජ්‍ය/සහකාර අධ්‍යක්‍ෂවරුන්ගේ සහ සියළුම සංවර්ධන/ක්‍ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2014/11/21 දින මහරගම ශ්‍රී ලංකා යූත් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

17. පශු සම්පත් රක්‍ෂණ යෝජනා ක්‍රමය ප්‍රධානව මණ්ඩලීය රක්‍ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී හා ප්‍රතිලාභ ගෙවීමේදී අවශ්‍ය වන ඡායාරූප ලබාගැනීම සඳහා වාරික වශයෙන්

ගෙවීමේ පදනම මත මණ්ඩලීය ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය වෙත ඩිජිටල් කැමරා ලබාදීමට ද කටයුතු කර ඇත.

18. 2014 වර්ෂයේදී දිවයින පුරා පැවති විශේෂ ප්‍රචාරක හා අලෙවිකරණ වැඩ සටහන්වලදී Back Drop, කොඩි, ප්‍රචාරක බැනර්, කටවුට් හා අත්පත්‍රිකා මඟින් මෙන්ම එම වැඩ සටහන් පිළිබඳව ජාතික විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය මඟින්ද පුළුල් ප්‍රචාරයක් ලබාදීමටද කටයුතු කර ඇත.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

## හා

## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

රක්‍ෂණ අංශය

වර්ෂයේ දී 2014ද මිට පෙර වර්ෂ වල දී මෙන් ම අංශයේ රාජකාරි කටයුතු සිදු කිරීමේ දී වන්දි නිදහස් කිරීමට මුල් තැන දී කටයුතු කළ අතර වර්තමාන වෙළඳපොළ තත්වයන් ද නිරීක්‍ෂණ කරමින් පවත්නා රක්‍ෂණ ක්‍රම යාවත් කාලීන කිරීමට කටයුතු කරන ලදි.

1. ණ කටයුතු යටතේ මණ්ඩලීයවගා රක්‍ෂ වර්ෂයේ දී 2014වගකීම ලෙස රුකට 65 මිලියන . ආසන්න මුදලක් වන්දි මුදල් ලෙස නිදහස් කිරීමට කටයුතු කර ඇත විශේෂ වන්දි නිදහස් ඒ මඟින් .යාත්මක කරන ලදිකිරීමේ ජංගම වැඩසටහන් කිහිපයක් ද මෙම වර්ෂය තුළ දී ක්‍රි .කි වියඅදාළ වන්දි මුදල් කඩිනමින් නිදහස් කිරීමට හැ
2. වගා රක්‍ෂණ කටයුතු සඳහා රක්‍ෂණ ආයතන අතර තරගකාරීත්වයක් ඇති කිරීම ට වෙළඳපොළ සමත්වී තිබීම හඳුනා ගත හැකි විය මයන් ණ යෝජනා ක්‍රඒබැවින් පවත්නා රක්‍ෂ . තාවහි කොන්දේසි හා වගන්ති වෙළඳ පොළ අවශ්‍යාය සැලකිල්ලට ගෙන සංශෝධනය කරන ලදි .ඒසේම වගා රක්‍ෂණ යෝජනා පත්‍රය හා හිමිකම් පෝරමය ද අවශ්‍යතාවයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදි .
3. පශු සම්පත් රක්‍ෂණය සිදු කෙරෙන රක්‍ෂණ ආයතන නිරතුරුව ම සංශෝධන සහිතව වෙළඳපොළ හැසිර වීමට උත්සහ ගත් බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කර මණ්ඩලීය පශු සම්පත් රක්‍ෂණ සඳහා සංශෝධන එක් කිරීමට පියවර ගන්නා ලදි 2014 ණ යටතේපශු රක්‍ෂ . 4. වර්ෂයට අදාළ ව ගෙවන ලද වන්දි මුදල් රු මිලියන4 කට ආසන්නය
4. ජාතික පොහොර සහනාධාර වැඩ පිළිවෙලට සමගාමීව ක්‍රියාත්මක වන වී වගා රක්‍ෂණය මහ කන්නයේ සිට මණ්ඩලීය වගකීමට පැවරෙනු බැවින් එයට අදාළ ගනුදෙනු 2015/2014 කිරීමට හා වන්දි නිදහස් කිරීමට අදා කරුවන් ලියාපදිංචිළ ක්‍රමෝපායන් සකස් කර ගැනීමට අවශ්‍ය මුලික පියවරයන් .වර්ෂයේ අග භාගයේ සිට ම ගනු ලැබීය 2014
5. වර්තමාන වෙළඳ පොළෙහි කෘෂිකාර්මික අවදානම් තත්වයන් හඳුනා ගැනීම සඳහා මෙන් ම කෘෂි රක්‍ෂණ කටයුතු වලදි වර්තමාන හැසිරීම් රටාව අවබෝධකර ගැනීම පිණිසත් අපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් .2014සැප්තැම්බර් මස පවත් වන ලද තෙදින වැඩමුළුව සඳහා නිලධාරීන් සහභාගී කර වීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.
6. ඒසේම රක්‍ෂණ වෙළඳපොළ තුළ කෘෂි රක්‍ෂණයේ හැසිරීම් රටාව හඳුනා ගැනීම සඳහා ශ්‍රි ලංකා රක්‍ෂණය මණ්ඩලය මගින් පවත්වන ලද මැයි මස දී 2014Micro Insurance සම්මන්ත්‍රනය සඳහා නිලධාරීන් යොමු කරවන ලදි.
7. සාමාන්‍ය රක්‍ෂණ කටයුතු තව දුරටත් පුළුල් කිරීමේ අරමුණින් මණ්ඩලය මඟින් හඳුන්වා දී ඇති සුව සෙත වෛද්‍ය රක්‍ෂණය සහ හදිසි අනතුරු රක්‍ෂණය අලෙවි කිරීමේ විශේෂ ප්‍රවර්ධන වැඩ සටහනක් යාත්මකවසන් කාර්තුවේ දී ක්‍රිවර්ෂයේ අ 2014 කරන ලදීමේ යටතේ උපයා . 3 මිලියන.ගත් ආදායම රු.5 කට ආසන්නය

# ගොවි විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ

## යෝජනා ක්‍රමය

## හා

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ

## යෝජනා ක්‍රමය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2010 අගභාගය වන විට මුහුණ පෑ මූල්‍ය අර්බුධය මත විශ්රාම වැටුප් ගෙවීම සඳහා අරමුදල් සම්පාදනය නොවූයෙන් 2012, 2013 වර්ෂවල විශ්‍රාම වැටුප් ගෙවීම සිදු නොකරන ලදී. එ බැවින් මේ සඳහා තිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිසංවිධානයන් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 අයවැය යෝජනා අනුව වැඩි ප්‍රතිලාභයක් සහිතව මෙම යෝජනා ක්‍රමය නව යෝජනා ක්‍රමයක් වශයෙන් නීතිගත කිරීමත්, 2014 වර්ෂයේ ජනවාරි සිට නව යෝජනා ක්‍රමයට අනුරූප වන පරිදි වැඩි ප්‍රතිලාභයක් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම නැවත ක්‍රියාත්මක කිරීමත් කරන ලද අතර එය සමස්ත ගොවි ජනතාව වෙනුවෙන් ගන්නා ලද වැදගත් පියවරකි.

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරමින් විශ්‍රාම වැටුප අඛණ්ඩව ගෙවීම සඳහා අරමුදල වශයෙන් 2014 අයවැය යෝජනා මඟින් රු: මිලියන 1000ක් ලබා දී ඇති අතර මෙයට අමතරව රු: මිලියන 1954ක් 2014 වර්ෂය තුල විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහාභාණ්ඩාගාරය මඟින් ලබා දී ඇත.

නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් ගෙවීම් පදනම් පහත දැක්වේ.

| වයස අවුරුදු | මාසික විශ්‍රාම වැටුප (රු: ) |
|---|---|
| 60 – 63 | 1000/- |
| 64 – 70 | 1250/- |
| 71 – 77 | 2000/- |
| 78 හා ඊට වැඩි | 5000/- |

ඒ අනුව 2014 වර්ෂයේ දෙසැම්බර් දක්වා දායකයින් 123,768ක් සඳහා රු: මිලි. 2098 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ලබා දී ඇත (සටහන 01)

## මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී මරණයට පත්වූ සහ බෙලහීනතාවයට පත්වූ දායකයින්ට මරණ පාරිතෝෂිත වශයෙන් රු: 6,185,192/- ක මුදලක් ද බෙලහීනතා ප්‍රතිලාභ වශයෙන් රු: 242,027/- ක මුදලක් ද 2014 වර්ෂයේදී ප්‍රතිලාභීන් වෙත ගෙවීමට අවශ්‍ය පියවර ගන්නා ලදී (සටහන 02)

## නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ සමීක්ෂණය.

මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ඇති දායකයින්ගේ තොරතුරු ලබා ගැනීමේ අරමුණෙන් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහය ලබා ගනිමින් ක්‍රියාත්මක කිරීම 2014 දෙසැම්බර් සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම තොරතුරු පදනම් කරගෙන ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයින් අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**<u>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>**

2014 වර්ෂය අවසන් වන විට දායකත්වය ලබා ඇති මුළු ධීවරයින් සංඛ්‍යාව 68,738 වන අතර විශ්‍රාම වැටුප් ලාභීන් 2,913 සඳහා රු: මිලියන 42.6 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. (සටහන 03, 04)

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබයි. එ බැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මෙන්ම ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් අරමුදල ඉදිරි වසර 05ක දී අවසන් වනු ඇත. එ බැවින් මෙම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ද අවශ්‍ය ප්‍රතිසංවිධානයන් කිරීමට පියවර ගෙන ඇත.

**<u>මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම.</u>**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් අතරින් මරණයට පත්වූ දායකයින් 37 සඳහා රු: 454,000ක මරණ පාරිතෝෂිත මුදලක් ද ගෙවා ඇත. (සටහන 05)

සටහන 1

## ගෙවූ විශ්‍රාම වැටුප් ගෙවීම - 2014

| | දිස්ත්‍රික්කය | විශ්‍රාම වැටුප් ලාභීන් ගණන | ගෙවූ විශ්‍රාම වැටුප් මුදල රු. |
|---|---|---|---|
| 1 | හම්බන්තොට | 6,379 | 105,781,456 |
| 2 | රත්නපුරය | 5,565 | 94,906,875 |
| 3 | යාපනය | 1,968 | 34,966,040 |
| 4 | වව්නියාව | 325 | 5,638,400 |
| 5 | මන්නාරම | 68 | 1,007,353 |
| 6 | මුලතිව් | 74 | 1,337,283 |
| 7 | කළුතර | 7,542 | 129,462,540 |
| 8 | ගාල්ල | 11,461 | 207,817,385 |
| 9 | කොළඹ | 4,692 | 80,111,898 |
| 10 | මාතර | 8,101 | 137,180,076 |
| 11 | මාතලේ | 3,606 | 59,111,563 |
| 12 | අම්පාර | 3,348 | 56,517,238 |
| 13 | මොණරාගල | 3,964 | 66,285,326 |
| 14 | මඩකලපුව/කිලිනොච් | 858 | 14,536,607 |
| 15 | ත්‍රිකුණාමලය | 707 | 11,867,571 |
| 16 | මහනුවර | 11,406 | 198,636,010 |
| 17 | කෑගල්ල | 7,296 | 120,478,914 |
| 18 | අනුරාධපුරය | 5,877 | 95,859,966 |
| 19 | බදුල්ල | 5,347 | 90,936,874 |
| 20 | නුවරඑළිය | 3,382 | 57,972,298 |
| 21 | පුත්තලම | 4,297 | 69,182,893 |
| 22 | ගම්පහ | 9,436 | 157,375,203 |
| 23 | කුරුණෑගල | 13,969 | 231,029,325 |
| 24 | පොළොන්නරුව | 4,100 | 70,385,558 |
| | එකතුව | **123,768** | **2,098,384,652.00** |

| මරණ හා බෙලහීන ප්‍රතිලාභ 2014 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | දිස්ත්‍රික්කය | මරණ සංඛ්‍යාව | ගෙවූ මුදල | බෙලහීන සංඛ්‍යාව | ගෙවූ මුදල | මුළු සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව |
| 1 | ගාල්ල | 10 | 225015.00 | 2 | 74801.00 | 12 | 299816.00 |
| 2 | කොළඹ | 3 | 72618.00 | 1 | 36441.00 | 4 | 109059.00 |
| 3 | මඩකලපුව | 1 | 26776.00 | | | 1 | 26776.00 |
| 4 | හම්බන්තොට | 21 | 457157.00 | | | 21 | 457157.00 |
| 5 | කළුතර | 13 | 252500.00 | 1 | 22958.00 | 14 | 275458.00 |
| 6 | මාතර | 17 | 308723.00 | | | 17 | 308723.00 |
| 7 | මොණරාගල | 26 | 588673.00 | 2 | 49899.00 | 28 | 638572.00 |
| 8 | ඇඹිලිපිටය | 5 | 112790.00 | | | 5 | 112790.00 |
| 9 | ගම්පහ | 11 | 242394.00 | | | 11 | 242394.00 |
| 10 | මනම්පිටිපිය | 5 | 352651.00 | | | 5 | 352651.00 |
| 11 | අම්පාර | 15 | 287315.00 | | | 15 | 287315.00 |
| 12 | රත්නපුරය | 15 | 299448.00 | | | 15 | 299448.00 |
| 13 | බදුල්ල | 11 | 223159.00 | | | 11 | 223159.00 |
| 14 | කෑගල්ල | 10 | 208685.00 | | | 10 | 208685.00 |
| 15 | මහව | 11 | 217018.00 | | | 11 | 217018.00 |
| 16 | මාතලේ | 9 | 212983.00 | 1 | 23338.00 | 10 | 236321.00 |
| 17 | මන්නාරම | 1 | 28099.00 | | | 1 | 28099.00 |
| 18 | නුවරඑළිය | 4 | 65929.00 | | | 4 | 65929.00 |
| 19 | මහනුවර | 12 | 207265.00 | | | 12 | 207265.00 |
| 20 | පුත්තලම | 18 | 425129.00 | | | 18 | 425129.00 |
| 21 | කුරුණෑගල | 9 | 192682.00 | | | 9 | 192682.00 |
| 22 | යාපනය | 14 | 310284.00 | | | 14 | 310284.00 |
| 23 | අනුරාධපුරය | 16 | 329637.00 | | | 16 | 329637.00 |
| 24 | තඹුත්තේගම | 7 | 180288.00 | | | 7 | 180288.00 |
| 25 | මහවැලි ජී | 2 | 40096.00 | | | 2 | 40096.00 |
| 26 | පොළොන්නරුව | 9 | 167295.00 | 1 | 34590.00 | 10 | 201885.00 |
| 27 | ත්‍රිකුණාමලය | 6 | 124589.00 | | | 6 | 124589.00 |
| 28 | මුලතිව් | 1 | 25994.00 | | | 1 | 25994.00 |
| | එකතුව | 282 | 6185192.00 | 8 | 242027.00 | 290 | 6427219.00 |

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## 2014.12.31 දිනට බඳවා ගැනීම්

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | වයස අනුව දායක සංඛ්‍යාව | | | | | | පසුගිය මසට මුළු දායක සංඛ්‍යාව | 2014 මුළු දායක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | | |
| කළුතර | 1213 | 721 | 772 | 197 | 105 | 59 | 3067 | 3067 |
| ගාල්ල | 1082 | 676 | 840 | 221 | 118 | 95 | 3032 | 3032 |
| මහවැව | 3253 | 1701 | 2036 | 612 | 256 | 240 | 8098 | 8098 |
| මාතර | 1747 | 973 | 1226 | 346 | 197 | 164 | 4653 | 4653 |
| කොළඹ | 576 | 360 | 478 | 140 | 63 | 38 | 1655 | 1655 |
| තංගල්ල | 2511 | 1387 | 1626 | 410 | 199 | 166 | 6299 | 6299 |
| පුත්තලම | 2167 | 1156 | 1222 | 255 | 107 | 61 | 4968 | 4968 |
| මීගමුව | 2538 | 1598 | 2163 | 734 | 417 | 377 | 7827 | 7827 |
| මඩකලපුව | 2248 | 1390 | 1630 | 556 | 267 | 264 | 6354 | 6355 |
| ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2008 | 2008 |
| මන්නාරම | 2050 | 1219 | 1322 | 421 | 213 | 241 | 5463 | 5466 |
| කල්මුනේ | 1565 | 1109 | 1515 | 479 | 243 | 206 | 5117 | 5117 |
| මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 | 429 |
| කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2017 | 2017 |
| යාපනය | 2131 | 1090 | 1409 | 651 | 385 | 588 | 6253 | 6254 |
| | | | | | | | | ***67245*** |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | | |
| නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 | 115 |
| පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 | 121 |
| රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | - | 55 | 55 |
| මොණරාගල | 17 | 14 | 10 | 1 | - | - | 42 | 42 |
| කුරුණෑගල | 45 | 24 | 24 | 1 | - | 2 | 96 | 96 |
| අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 | 363 |
| මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 | 78 |
| නුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 | 61 |
| කෑගල්ල | 1 | 1 | 2 | - | - | - | 4 | 4 |
| බදුල්ල | 59 | 33 | 33 | 3 | - | 3 | 131 | 131 |
| වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | - | 152 | 152 |
| මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 | 275 |
| එකතුව | | | | | | | | ***1493*** |
| මුළු එකතුව | **24921** | **14657** | **17862** | **5544** | **2905** | **2849** | **68733** | **68738** |

ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ වාර්තාව 2014

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | විශ්‍රාම වැටුප් ගෙවීම 2014 වර්ෂය තුළ | |
|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල |
| කළුතර | 75 | 1,096,802.00 |
| ගාල්ල | 102 | 1,387,233.00 |
| මහවැව | 282 | 3,821,013.00 |
| මාතර | 267 | 3,746,532.00 |
| කොළඹ | 48 | 595,380.00 |
| තංගල්ල | 180 | 2,586,790.00 |
| පුත්තලම | 42 | 619,213.00 |
| මීගමුව | 458 | 6,109,385.00 |
| මඩකලපුව | 292 | 4,291,282.00 |
| ත්‍රිකුණාමලය | 74 | 1,186,390.00 |
| මන්නාරම | 268 | 3,819,424.00 |
| කල්මුනේ | 261 | 3,669,731.00 |
| මුලතිව් | 6 | 178,596.00 |
| කිලිනොච්චි | 122 | 2,991,668.00 |
| යාපනය | 390 | 5,908,026.00 |
| **මිරිදිය ධීවර ජලාශ** | | |
| නුවරඑළිය | 8 | 101,004.00 |
| පොළොන්නරුව | 2 | 27,000.00 |
| රත්නපුර | 1 | 14,196.00 |
| මොණරාගල | - | - |
| කුරුණෑගල | 1 | 14,004.00 |
| අනුරාධපුර | 2 | 24,000.00 |
| මාතලේ | 4 | 52,476.00 |
| නුවර | 7 | 84,399.00 |
| කෑගල්ල | - | |
| බදුල්ල | 3 | 36,600.00 |
| වව්නියා | - | 5,085.00 |
| මඩකලපුව මිරිදිය | 18 | 234,747.00 |
| එකතුව | 2913 | 42,600,976.00 |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම - 2014 වර්ෂය තුල

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ පාරිතෝෂික ගෙවීම | |
|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල රු |
| කළුතර | 1 | 15,000.00 |
| ගාල්ල | | |
| මහවැව | 3 | 33,000.00 |
| මාතර | 1 | 15,000.00 |
| කොළඹ | 1 | 8,000.00 |
| තංගල්ල | | |
| පුත්තලම | | |
| මීගමුව | 2 | 16,000.00 |
| මඩකලපුව | 2 | 16,000.00 |
| ත්‍රිකුණාමලය | 1 | 10,000.00 |
| මන්නාරම | 4 | 56,000.00 |
| කල්මුනේ | | |
| මුලතිව් | | |
| කිලිනොච්චි | 15 | 194,000.00 |
| යාපනය | 7 | 91,000.00 |
| **මිරිදිය ධීවර ජලාශ** | | |
| නුවරඑළිය | | |
| පොළොන්නරුව | | |
| රත්නපුර | - | - |
| මොණරාගල | - | - |
| කුරුණෑගල | - | - |
| අනුරාධපුර | - | - |
| මාතලේ | - | - |
| නුවර | - | - |
| කෑගල්ල | - | - |
| බදුල්ල | - | - |
| වව්නියා | - | - |
| මඩකලපුව මිරිදිය | - | - |
| එකතුව | - | - |
| මුළු එකතුව | | |
| එකතුව | 37 | 454,000.00 |

# පරිපාලන හා මානව සම්පත් අංශය

පරිපාලන හා මානව සම්පත් අංශය

කාර්ය මණ්ඩලය

2014.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

කාර්ය මණ්ඩල සංයුතිය

| සේවාගණය | තනතුරු නාමය | අනුමත සේවකසංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| **HM** | අධ්‍යක්‍ෂජනරාල් | 1 | 1 | - |
| **HM** | අධ්‍යක්‍ෂ | 5 | 1 | 4 |
| කළමනාකරණ | | | | |
| **MM** | නියෝජ්‍යඅධ්‍යක්‍ෂ/ සහකාර අධ්‍යක්‍ෂ | 45 | 34 | 11 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| **JM** | පරිපාලනනිලධාරි | 2 | 1 | 1 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | 1 | - |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| **ASS.O** | සංවර්ධනනිලධාරි | 55 | 33 | 22 |
| | සැපයුම් නිලධාරි | 1 | 1 | - |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්‍ෂණික) | | | | |
| **MA - Tech** | ප්‍රවාහනසහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | 1 | - |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | මෘදුකාංග/දෘඩාංග කාර්මික ශිල්පී | 1 | 1 | - |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන) | | | | |
| **MA - NonTech** | කළමනාකරණසහකාර | 220 | 164 | 56 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| **PL - Skilled** | රියදුරු | 38 | 24 | 14 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| **PL - Non Skilled** | කාර්යාලසහායක | 42 | 32 | 10 |
| | | **421** | **296** | **125** |

ඉහත සඳහන් පුරප්පාඩු 125 අතුරින් තනතුරු පුරප්පාඩු 114ක් සඳහා 2014.09.29 හා 30 දිනවල ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවා ඇති අතර, අදාළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ වලට කැඳවීම් කර බඳවා ගැනීමේ ක්‍රියාවලිය දැනට සිදු කෙරෙමින් පවතී. පසුගිය ජනාධිපතිවරණය හේතුවෙන් අදාළ කාලසීමාව තුළ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අත්හිටුවා තිබිණ.

**<u>සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු</u>**

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සී/ස නිපුණතා සංවර්ධන අරමුදල මඟින් 2014.03.24 දින සංවිධානය කරන ලද "කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ගෙවීම" පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා මෙම මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන) අයි.ජේ.ඒ.ධර්මවර්ධන මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) අයි.යූ.කේ.කළුආරච්චි මහතා සහභාගී කරවන ලදී. තවද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයට අයත් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය 2014.04.03 හා 04 දෙදින සංවිධානය කළ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ දෙදින වැඩමුළුව සඳහා වැඩබලන ප්‍රවාහන සහකාර රංජිත් සමරනායක මහතා සහභාගී විය. 2014.07.18 හා 2014.07.19 දෙදින කොළඹ 05, කිරුළපන "විනය කළමනාකරණ කේන්ද්‍රය" මෙහෙයවන ලද "විධිමත් විනය පාලනය මඟින් මානව සම්පත් වර්ධනය කිරීමේ" දෙදින වැඩමුළුම සඳහා සහකාර අධ්‍යක්ෂ(පාලන) ඒ.එල්.ඩී.පී.එස්.අබේපිටිය මහතා සහභාගී කරවන ලදී.

තවද ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මඟින් පවත්වන ලද දින 12 දෙමළ භාෂා පුහුණු වැඩසටහන සඳහා කළමනාකරණ සහකාර ඩබ්.ටී.යූ.රේණුකා මිය හා තේජා විජේවික්‍රම මෙනවිය සහභාගී කරවන ලදී. 2014.10.23 දින "නිපුණතා සංවර්ධන අරමුදල" මඟින් පවත්වන ලද "සේවක නිවාඩු හා නීත්‍යානුකූල ප්‍රතිපාදන" පිළිබඳ එක් දින වැඩමුළුව සඳහා පරිපාලන නිලධාරි ආර්.එම්.එම්.එස්.රත්නායක මහතා සහභාගි විය. මෙම ආයතනය විසින් 2014.12.22 දින පවත්වන ලද "මුදල් ප්‍රවාහය හා මුදල් කළමනාකරණය පිළිබඳ එක් දින වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ(මුදල්) එස්.කේ.සුහසිංහ මහතා සහභාගී කරවන ලදී.

මීට අතිරේකව මණ්ඩලයේ මෙහෙයුම් අංශයේ සංවිධායකත්වයෙන් 2014.11.21 දින මහරගම ජාතික තරුණ මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී මණ්ඩලයේ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිළිබඳ මණ්ඩලීය දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

**<u>සේවක සුභසාධනය</u>**

මණ්ඩලයේ සේවකයින් සඳහා උදේ, සවස තේ සැපයීමේ වැඩපිළිවෙල හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පෙර වර්ෂයේදී මෙන් මෙම වර්ෂය තුළද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

**<u>ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය</u>**

2014 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල අවශ්‍යතා වෙනුවෙන් කාර්යාල උපකරණ හා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් පෙර වර්ෂ වලදී මෙන්ම කාර්යාල අවශ්‍යතා පරිදි සිදු කරන ලදී. මෙම වසර තුළ මණ්ඩලයේ වාහන සංචිතයට අයත් වාහනවල එදිනෙදා අලුත්වැඩියාවන් හා වාර සේවාවන් හැර වාහන මිලදී ගැනීම් කිසිවක් සිදු නොවීය.

කාර්යාල ගොඩනැගිලි

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මෙම වසර තුලදීද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 25ක් පවත්වාගෙන යනු ලබන අතර, ඉන් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි. අනෙක් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තව දුරටත් පවත්වාගෙන යනු ලබේ.

සේවක විනය කටයුතු

මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් 2014 වර්ෂය තුල ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විය.

1. ලිපිකරු කේ.ජී.සුදත් බණ්ඩාර මයාට එරෙහිව පවරා ඇති B/520/03 නඩුව හා ක්ෂේත්‍ර නිලධාරී කේ.ජී.හීන්බණ්ඩාර මයාට එරෙහිව පවරා තිබූB/2171/2 නඩුවඅනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේදී විභාග වෙමින් පවතී.

2. මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුවී ඇති ගොවි විශ්‍රාම වැටුප් වාර මුදල් වංචා කිරීමේ සිද්ධියට අදාළව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති B 3012/නඩුව විභාග වෙමින් පවතී.

3. සේවයෙන් ඉවත් කරනු ලැබ ඇති ජී.කේ.එම්.ඉල්ලියාස් මයා විසින් පවරා ඇති 23/කු/6833/98 නඩුවේ අභියාචනා පෙත්සම කුරුණෑගල සිවිල් අභියාචනා මහාධිකරණයේදි පැමිණිල්ලේ වාසියට තීන්දු විය. මෙම නඩු තීන්දුවට විරුද්ධව මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කරන ලදී. පැමිණිලි පක්ෂයෙන්ද ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. අදාළ නඩුව විභාග වෙමින් පවතී.

4. මණ්ඩලය විසින් ලංකා බැංකුවට එරෙහිව පවරනු ලැබ ඇති 21843,21844 හා 21845 දරණ නඩුවල ඒකාබද්ධ නියෝගයට එරෙහිව ලංකා බැංකුව ගොනු කර ඇති WP/HCCA/Col 312/2003 (f) දරණ අභියාචනා පෙත්සම සිවිල් අභියාචනා මහාධිකරණයේදී විභාග වෙමින් පවතී.

5. මහේෂිදිලිනි බුද්ධිකා මෙය පුහුණුව අවසන් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව ඇඹිලිපිටිය කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති 6ඊ/7030/1/1 දරණ නඩුව විභාග වෙමින් පවතී.

6. ටෙරන්ස් වරුෂවිතාන මහතා මණ්ඩලයට එරෙහිව බදුල්ල කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති අංක 05/20356/2013 දරණ නඩුව විභාග වෙමින් පවතී .

7. කේ.එච්.එස්.සංජීව මහතා මණ්ඩලයට එරෙහිව මහරගම කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ අංක 33/1124/2013 දරණ නඩුවට අදාළ ඉල්ලුම් පත්‍රය කාලාවරෝධ වීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර නඩුව අවසන් විය.

## 2014.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

**කාර්යය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය**

පුරුෂ - 186

ස්ත්‍රී - 110

එකතුව - 296




**වයස් විශ්ලේෂණය**

| වයස්කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 28 | 9% |
| 51 - 55 | 76 | 26% |
| 46 - 50 | 44 | 15% |
| 41 - 45 | 39 | 13% |
| 36 - 40 | 52 | 18% |
| 31 - 35 | 46 | 15% |
| 30 ට අඩු | 11 | 4% |
| එකතුව | 296 | 100% |




**සේවා කාලය අනුව විශ්ලේෂණය**

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30 ට වැඩි | 13 | 2% |
| 26 - 30 | 76 | 14% |
| 21 - 25 | 37 | 23% |
| 16 - 20 | 17 | 8% |
| 15 ට අඩු | 153 | 53% |
| එකතුව | 296 | 100 |




**2014 වර්ෂය තුළ විශ්‍රාම යාම් හා සේවයෙන් ඉවත්වීම්**

පුරුෂ - 03

ස්ත්‍රී - 03

එකතුව - 06

**2014 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්**

- බාහිර බඳවා ගැනීම් - 02
- අභ්‍යන්තර බඳවා ගැනීම් - 05
- උසස් වීම් - 06

# අභ්‍යන්තර විගණන අංශය

# අභ්‍යන්තර විගණන අංශය

2014 වර්ෂය සඳහාක් කාර්යාල ම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රියාත්මක යෝජනා ක්‍රමණ්ඩලයේ ක්‍රි , න්තර විගණන කටයුතු න්තර විගණන වැඩසටහන පරිදි අභ්‍යඅනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍ය .යාත්මක කරන ලදීක්‍රි

ඒ අනුවධාන කාර්යාලීය හා දිප්‍ර ,ම වෙනුවෙන්යාත්මක යෝජනා ක්‍රමණ්ඩලයේ ක්‍රි ,ස්ත්‍රික් කාර්යාලීය මට්ටමින් කළමණාකරණ සහකාර,ක්ෂය අධ්‍යනියෝජ්) මෙම අංශයේ සීමිත මානව සම්පත් , ,(විගණන)කළමණාකරණ සහකාර6 න්තර විගණන පරීක්ෂණමාණය මත වුවද අභ්‍යප්‍ර (0 ක් සිදුකරන ලදී.

එමෙන්ම ක් කාර්යාල කටයුතුමණ්ඩලයේ සියළුම අංශ සහ දිස්ත්‍රි ,(ආවරණය වන පරිදි) වල ක්‍රියාත්මක පාලන ක්‍රම පිළිබඳව ඒවායේ ප්‍රමාණාත්මකභාවය හා ක්‍රියාකාරීත්වය ඇගයීම් කරමින් පහත ක්ෂේත්‍රයන් යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදුකරන ලදී .

පරිපාලන හා මානව සම්පත් සඳහාණය ,තොග ලේඛණ පවත්වා ගැනීම,සේවකයින් බඳවා ගැනීම්, අය නොවන ආපදා ණය ශ ,මුදල් නිකුත් කිරීමේෂ අයකර ගැනීමවැටුප් වර්ධක ගෙවීම් හා වැටුප් , අත්තිකාරම් පියවීම්සහ ,නිවාඩු සහ වාර්තා එවීම /ක් කාර්යාලයීය පැමිණීමදිස්ත්‍රි ,පියවරෙහි පිහිටුවීම් .ණ කටයුතු සිදුකර ඇතතිලාභ ගෙවීම් පරීක්‍ෂධාර ප්‍රවෙදාා

මීට අමතරවඅතිකාල ගෙවී ,ජංගම නොවන වත්කම් ශේෂය ,අවසාන තොග ශේෂය,මධාවන , වලට අදාල ,මය කටයුතුසහනීති ,ස්ථාවර වත්කම් මිලදී ගැනීම ,වාහන නඩත්තු කිරීම්,සටහන් .ණ කටයුතු සිදුකරන ලදීපරීක්‍ෂ

මුදල් අංශයේ කටයුතු වලට අදාළව,මුදල් පොත් හා බැංකු සැසඳුම් පරීක්ෂාවන් යටතේ ණය සහ අත්තිකාරම් ගිණුමම වැටුපගොවි විශ්‍රා ,පශු සම්පත් රක්ෂණ ගිණුම ,ී පරිපාලන ගිණුමම ධීවර විශ්‍රා, ,රාම වැටුප් පරිපාලන ගිණුමධීවර විශ් ,වැටුප් රැස් කිරීමේ ගිණුමඅතිරේක භෝග වගා රක්ෂණ ගිණුම , දිස්ත්‍රික් පරිපාලන ගිණුම් කැගල්ලමාතර ,පොළොන්නරුව , පරීක්‍ෂාකර ඇත.

මුදල්පොත් ,කෘෂි රක්ෂණ පරිපාලන ගිණුම,සහ ගෙවීම් වව්චර් පරීක්ෂාව යටතේ ,ගොවි විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම ,ධීවර විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම ,ග්ධන ගිණුමප්‍රා ,බඩඉරිඟු වගා රක්‍ෂණ වන්දිගිණුම සහ පශු රක්‍ෂණ වන්දි ගිණුම පරීක්‍ෂා කරන ලදී.

මීට අමතරව ,තිපාදන ලැබීම්පුනරාවර්ථන ප්‍ර ,වී වගා රක්‍ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම , කුවිතාන්සි පොත් නිකුත් කිරීම් සහපශු රක්‍ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම පරීක්‍ෂා කර ඇත . ආයෝජන,තවදශේෂය පිළිබඳ පරීක්ෂාව ,නොවන වත්කම් ශේෂයජංගම ,අවසාන තොග ශේෂය , නියෝජිත ආයතන මගින් පසු වාරික මුදල් ,තිපාදන මගින් ස්ථාවර වත්කම් මිලදී ගැනීම්ග්ධන ප්‍රා අය කිරිම සේවක,ණය නිකුත් කිරීම් ,අත්තිකාරම් පියවීම්සහ ප්‍රධාන කාර්යාලයේ සුළු මුදල් අග්‍රිමය යන පරීක්‍ෂණ සිදුකර ඇත.

දිස්ත්‍රික් පරිපාලන ගිණුම් යටතේනුවර ,කුරුණෑගල ,මාතර ,පොළොන්නරුව ,කෑගල්ල, පුත්තල ,මාතලේ ,ක් කාර්යාලීය රැස්කිරීමේ ගිණුම යටතේ පොළොන්නරුවඑළියසහදිස්ත්‍රිම , .න ලදීනුවර එළිය යන පරීක්ෂන කටයුතු ද සිදු කර ,කෑගල්ල ,තඹුත්තේගම,කුරුණෑගල

රක්‍ෂණ අංශයේ කටයුතු ආවරණය වන පරිදි හා වාරික මුදල් අයකිරීම ණ යෝජනා පත්‍රපශු රක්‍ෂ , ,ෂණය කිරීමණය කිරීම වාර මුදල් අයකිරීම ප්‍රේණය දෙන ආයතන මගින් රක්‍ෂ ,ෂණය කිරීමප්‍රේ

කුවිතාන්සි පොත් පාලනය යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදීහ තිලාණ ප්‍රපශු සම්පත් රක්‍ෂ ,තවද . ,(අම්පාර)ණ වන්දි ගෙවීම්වී වගා රක්‍ෂ,ගෙවීම් පරීක්ෂාවබඩඉරිගු වගාවන්දි ගෙවීම් යන (අනුරාධපුරය) .ණ කටයුතු සිදුකරන ලදීපරීක්‍ෂ

මෙහෙයුම් අංශයේ කටයුතු ආවරණය වන පරිදි ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කිරීම හා ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීමපිළිබද පරීක්ෂා කිරීම යන (කාරී සැලැස්ම අනුවයාක්‍රි) ගතියසමස්ථ ප්‍ර,ඉලක්ක ඉටු කිරීම , .ණ කටයුතු සිදුකර ඇතපරීක්‍ෂ

විශ්‍රාම වැටුප් අංශයට අදාළවහිමිකම් ,ම වැටුප් ගෙවීම්මයේවිශ්‍රාම වැටුප් යෝජනා ක්‍රගොවි විශ්‍රා , ම වැටුප් ආපනොපෑ විශ්‍රාසු ගෙන්වා ගැනීම මරණ හා ,ම වැටුප් ගෙවීමතැපැල් කාර්යාල මගින් විශ්‍රා , ,(නියොජිත ආයතන මගින්)පසු වාරිකමුදල් අය කිරීම,තිලාභ ගෙවීමප්‍රගොවි විශ්‍රාම වැටුප් පරිපාලන වියදම් .ණ සිදුකරන ලදීම වැටුප් පරිපාලන වියදම් පිළිබද පරීක්‍ෂසහ ධීවර විශ්‍රා ,

දිස්ත්‍රික් කාර්යාල පරීක්‍ෂාව යටතේ කෑගල්ලකුරුණෑගල , සහ තඹුත්තේගම දිස්ත්‍රික් කාර්යාල කටයුතු,පැමිණීම හා නිවාඩුකුවිතාන්සි පො ,වත්කම් ලේඛණය ,ත් පාලනයවාරික මුදල් අය කිරීම , සහ ධාවන සටහන් ඇතුළුව පරීක්‍ෂා කරන ලදී.

# මුදල් අංශය

## මූල්‍ය සම්පිණ්ඩනය

2013වර්ෂයහා සැසඳීමේ දි 2014 වර්ෂයතුල කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමයේ ආදායමේ 27% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එනම් 2013 දී රු.මි.93.8 ක් වූ වාරික ආදායම 2014 වර්ෂය තුලදී රු.මි. 119.6 ක් දක්වා වර්ධනය විය. එසේම මෙම වර්ෂය තුළ දී රු.මි. 68.1 ක වන්දි ගෙවීම සිදුවූ අතර මෙම වර්ෂය තුලදී යෝජනා ක්‍රමයරු.මි. 17.8 ශුද්ධ ලාභදායී තත්වයක් ද පෙන්නුම් කරයි.

ශ්‍රි.ල.ගි.ප්‍ර 39 .හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව ,ණය සහ ලැබිය යුතු දෑ ,කල්පිරීම තෙක් රඳවා ගත් ආයෝජන ,විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් ලෙස නම් කළ ව්‍යුත්පන්න හරහා සාධරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදි සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ .

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ආරම්භයේදි ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ . අනෙකුත් සියලු මූල්‍ය වත්කම්) ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිති කළ වත්කම් ඇතුළුව (ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය .

යම් වත්කමකින් මුදල් පුවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසාන වීමේදී හෝ මූල්‍ය වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකිය යුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත් කරනු ලැබේ .පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැඳියාවක් ,වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍යා වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කර

බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක්ම ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ .

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කොටි කාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ .

**ඒ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා තබා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුලත් වේ .මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත් කර ගෙන ඇත්නම් ,ඒවා වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ .

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ,විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ .

**ඕ ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩු කොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ .ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි .සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ .හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ .

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ ,සේවක ණය ,තැන්පතු ,අත්තිකාරම් , අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි .

**(ඕ) කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මත අභිප්‍රායක් සහ හැකියාවක් ඇති විටදී ඒවා කල් පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ .මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන හානි අඩු කොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ .සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ .හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන ,කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ .

**ක විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට ,අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ .

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත .

### 2.4.1 මූල්‍ය වත්කම් හානි

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම් ,වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

## 3 බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය .ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී ,දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති- 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ සහ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත .සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි .බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ .

### 3.2 බදුකරණය

1990අංක 22 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන ප්‍රකාරව මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ .

### 3.3 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.4 ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම්

ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 ,දී සිදුකරන ලද ආයුගණක ගණනයකිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත .

## 4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

### 4.1 ආදායම

ඇ) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික ,භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි .

ඇ) වාරික එකතු කිරීමෙන් ලත් සියලුම ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ . ප්‍ර

### 4.2 ආදායම පිළිගැනීම

අ .  රක්ෂණ වාරික ආදායම බඳවාගත් කාලය සඳහා පිළිගනු ලැබේ .

ආ .  ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ.  උපචිත ආදායම කාල පදනමකින් උපචිත වේ .

**4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය**

දරනලද වියදම් සඳහා මණ්ඩලයට හානි පූරණය කරන පුදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළදීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායමක් ලෙස පිළිගනු ලැබේ .වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට හානි පූරණය කරන ප්‍රදාන , ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

**4.4 වියදම්**

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපැයුම අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබයි .මණ්ඩලයේ ක්‍රියාකාරකම් මෙහෙයවීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයකින් පවත්වාගෙන යාමේදී දරන ලද සියලු වියදම් ,වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය කරා ළඟා වීමේදී උපචිත පදනමකින් ආදායමට බැර කොට ඇත .

අංක 15.10.2008- 4/401 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම්

| **වියදම්** | **අනුපාත** |
|---|---|
| කුලීදුරකථන , | 5% |
| තැපැල් ගාස්තු, ජල ගාස්තු | 5% |
| විදුලිය | 5% |
| කාර්යාල උපකරණ නඩත්තුව | 5% |
| ගොඩනැගිලි නඩත්තුව | 5% |
| Main M/V | 3% |
| ඉන්ධන | 2% |
| ලිපිද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂාව | 5% |
| පරිගණක වියදම් | 5% |

**5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ“ වක්‍ර ක්‍රමය ”යොදා ගනිමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිය 07- ‘මුදල් ප්‍රවාහ ප්‍රකාශය‘ ප්‍රකාරව සකස් කර ඇත .

**6 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල වාස්තවිකත්වය සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත .

7 **අනිශ්චිත අවස්ථා**

**ලැබිය යුතු පොළී**

1996දී භාණ්ඩාගාර බිල්පත් ආයෝජන මත පොළිය අහිමිවීම වෙනුවෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත.

ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| නඩු අංකය | මුදල (රු) |
|---|---:|
| MR 21843 | 1,454,670.84 |
| MR 21844 | 1,172,602.46 |
| MR 21845 | 2,784,657.55 |

තීන්දුව මණ්ඩලයට වාසිදායක අයුරින් ලැබී ඇතත් එම තීන්දුවට එරෙහිව ලංකා බැංකුව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත්කර ඇත.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
**සටහන -01**
**2014 දෙසැම්බර් 31 දිනට පිරියත, දේපළ හා උපකරණ**

| විස්තරය | කාර්යාල උපකරණ | සුබසාධන උපකරණ | ලීබඩු හා සවිකිරීම් | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 ජනවාරි 1 දිනට පිරිවැය | 380,728.50 | 1,325.00 | 50,376.92 | 259,515.00 | 691,945.42 |
| එකතු කළා. එකතුකිරීම් | - | - | - | - | - |
| අඩුකළා. බැහැරකිරීම් | - | - | - | - | - |
| **2014 දෙසැ.31 දිනට මුළු පිරිවැය** | **380,728.50** | **1,325.00** | **50,376.92** | **259,515.00** | 691,945.42 |
| ක්ෂයවීම් අනුපාතය | 10% | 10% | 10% | 20% | |
| සමුච්චිත ක්ෂයවීම 2014 ජනවාරි 31 දිනට | 380,728.50 | 1,325.00 | 50,376.92 | 256,775.00 | 690,205.42 |
| අඩුකළා. බැහැරකිරීම් | - | - | - | - | - |
| වර්ෂය සඳහා ක්ෂයවීම | | | | 908.00 | 908.00 |
| **මුළු ක්ෂයවීම** | **380,728.50** | **1,325.00** | **50,376.92** | **259,515.00** | **691,945.42** |
| **ශුද්ධ වටිනාකම** | | | | **832.00** | **832.00** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2014 12.31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| සටහන 02 - තොග | 2014.12.31<br>රු. ශත | 2013.12.31<br>රු. ශත |
|---|---|---|
| මුද්‍රණ ද්‍රව්‍ය | 189,206.27 | 154,252.55 |
| | **189,206.27** | **154,252.55** |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| ගොවි විශ්‍රාම වැටුප් ණය | 646,247,409.47 | 638,676,801.39 |
| ලැබිය යුතු දෑ- FSH දෙපාර්තමේන්තුව | - | 1,500,000.00 |
| මරණ පාරිතෝෂික අත්තිකාරම් | 45,000.00 | 50,000.00 |
| ලැබිය යුතු වාරික | 332,401.00 | 155,688.00 |
| | **646,624,810.00** | **640,382,489.39** |
| **සටහන 04 -කල්පිරීවම තෙක් රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර** | | |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 16,649,954.02 | 24,056,771.80 |
| | **16,649,954.02** | **24,056,771.80** |
| **සටහන 05- බැංකුවේ ඇති මුදල්** | | |
| ගි.අංක. 164790 ලංකා බැංකු යූනියන් පෙදෙස | 382,645.62 | 511,697.23 |
| ගි.අංක. 164795 ලංකා බැංකු යූනියන් පෙදෙස | 674,780.07 | 846,931.29 |
| | **1,057,425.00** | **1,358,628.52** |
| **සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (1,711,647,610.36) | (1,529,127,538.52) |
| විශ්‍රාම වැටුප් බැරකමේ වත්මන් වටිනාකම - 2009 දක්වා | | |
| පෙර වසරේ ගැලපුම | - | - |
| | (1,711,647,610.36) | (1,529,127,538.52) |
| වර්ෂය තුළදී එකතුකිරීම් | | |
| වසර සඳහා මුළු අතිරික්තය/(හිඟය) | (218,723,803.85) | (182,520,071.84) |
| | (1.930,371,414.21) | (1,711,647,610.36 ) |
| | **(1.930,371,414.21)** | **(1,711,647,610.36 )** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2014 12.31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | **2014.12.31**<br>රු. ශත | **2013.12.31**<br>රු. ශත |
|---|---|---|
| **සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 20210,079.70 | 19198,329.70 |
| එකතුකළා: | | |
| වසර සඳහා දායක මුදල් | 1675,730.00 | 1691,660.00 |
| අඩුකළා: | | |
| මරණ පාරිතෝෂික ගෙවීම් | 360,000.00 | 679,910.00 |
| | 360,000.00 | 679,910.00 |
| | **1,315,730.00** | **1,011750.00** |
| | **21,525,809.70** | **20,210,079.70** |
| **සටහන 08 - ගෙවිය යුතු දෑ** | | |
| ගෙවිය යුතු- විශ්රාම වැටුප් ගෙවීම | 1,636,243.00 | 1,644,753.00 |
| ගෙවිය යුතු- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්රමය | 12,487,406.38 | 8,704,380.10 |
| ගෙවිය යුතු - ආපදු ගෙවිය යුතු දායක මුදල | 331,552.00 | 119,391.00 |
| ගෙවිය යුතු - මරණ පාරිතෝෂිකය | 187,000.00 | 286,000.00 |
| ගෙවිය යුතු- දිරිදීමනා | 22,050,00 | 52,250.00 |
| ගෙවිය යුතු - දායක මුදල් මත ආපසු ගෙවන පොළිය | 357,129.00 | 72,846.00 |
| | **15,021,380.38** | **10,879,620.10** |
| **සටහන 9 - උපචිත වියදම්** | | |
| මුද්රණ ගාස්තු | 315,000.00 | 240,000.00 |
| නෛතික ගාස්තු | 17,000.00 | 17,000.00 |
| විගණන ගාස්තු සඳහා ප්රතිපාදන | 1,259,025.00 | 1,159,025.00 |
| | **1,591,025.00** | **1,416,025.00** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2014 12.31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | **2014.12.31**<br>රු. ශත | **2013.12.31**<br>රු. ශත |
|---|---|---|
| සටහන 10 - පරිපාලන වියදම් | | |
| වැටුප් සහ වේතන | 1,883,402.10 | 1,660,162.73 |
| සේ.අ.අ දායක මුදල | 226,008.26 | 198,571.54 |
| සේ.භා.අ .දායක මුදල් | 56,502.06 | 49,642.88 |
| අතිකාල | 11,092.00 | 21,962.00 |
| TAC සාමාජිකයන්ට දීමනා | 6,000.00 | 10,500.00 |
| විශේෂ දීමනා | 522,928.00 | 390,528.00 |
| පාරිතෝෂික | 106,160.00 | 100,555.00 |
| නෛතික ගාස්තු | 300,000.00 | - |
| ඉන්ධන | 141,613.18 | 122,417.77 |
| ලිපි ද්‍රව්‍ය | 57,695.95 | 51,543.14 |
| මුද්‍රණ | 81,296.28 | 139,568.75 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 4,931.14 | 5,482.18 |
| කුලී | 711,129.46 | 617,796.71 |
| දුරකථන | 110,677.16 | 86,550.73 |
| තැපැල් ගාස්තු | 52,128.10 | 63,419.52 |
| ජල බිල්පත් | 20,395.99 | 16,220.49 |
| ආරක්ෂක | 37,818.00 | 34,592.48 |
| විදුලිය | 132,459.27 | 115,497.85 |
| රථ වාහන නඩත්තුව | 189,727.27 | 124,392.19 |
| ගොඩනැගිලි නඩත්තුව | 19,700.49 | 10,065.27 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 53,025.06 | 23,071.42 |
| පරිගණක වියදම් | 7,425.79 | 11,844.35 |
| ක්ෂයවීම | 908.00 | 1,226.60 |
| විගණන ගාස්තු | 100,000.00 | 100,000.00 |
| | **4,832,931.00** | 3,955,611.60 |
| | | |
| සටහන 11 - මූල්‍ය ගාස්තු | | |
| බැංක ගාස්තු | 561.16 | 7,500.31 |
| | **561.16** | **7,500.31** |

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/ඊ/ඒඒඅයිබී/1/14/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 අප්‍රේල් දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මාගේ සමාංක හා 2015 දෙසැම්බර් 14 දිනැති ලිපියට යොමු වේ.

2. ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

2. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. එෆ්බී/ඊ/ඒඒඅයිබී/1/14/17 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 දෙසැම්බර් 14 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14( 2 )( සී ) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2015 අගෝස්තු 25 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය

සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ප්‍රමිතියේ 54 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වර්ගීකරණයන් සහිතව ජංගම වත්කම් හා ජංගම වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විධිමත්ව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

පිළිවෙලින් රු.3,000,000 ක් හා රු.2,203,492 ක් වූ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන හා රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය මූල්‍ය කටයුතු ලෙස වර්ගීකරණය කරනු වෙනුවට ආයෝජන කටයුතු ලෙස සාවද්‍ය ලෙස වර්ගීකරණය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා දෝෂ

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් ලෙස පෙර වර්ෂ ගැලපීම් පිළිබඳ විස්තර හෙළි දරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

මණ්ඩලය විසින් මේ වනවිටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන 21 කට වැඩි ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

(ඉ) ශ්‍රී ලං ගි ප්‍ර 19 - සේවක ප්‍රතිලාභ

විශ්‍රාම ප්‍රතිලාභ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. තවද ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ අනාගත වගකීම් ඉටුකිරීමට හැකිවනු පිණිස නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයු ගණක ඇගයීම මඟින් කරන ලද දායකය සේවාදායක විසින් ආයෝජනය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලං ගි ප්‍ර 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළ පැවතියද, ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ

රු.34,852,840 ක් වූ සේවක ණය හඳුනාගෙන මූල්‍ය වත්කම් ලෙස මිණුම් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලන වියදම් රු.3,010,676 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තයද එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.46,822 ක් වූ පොලී ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය හා 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය, කොමිස් වියදම් හා කුඹුරු ආදායම සහ ගෙවිය යුතු රක්ෂණ කොමිස් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පිළිවෙලින් රු.4,182,288 කින්, රු.1,151,341 කින් හා රු.194,501 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළව රු.380,249 ක් වූ බැංකුවේ ඇති මුදල් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) ගොවි විශ්‍රාම වැටුපෙන් ලැබිය යුතු ණය මුදලට එරෙහිව අයකරන ලද රු.17,726,796 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබූ අතර ඒ අනුව වර්ෂය සඳහා අතිරික්තය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමෙන් පසු ශුද්ධ අතිරික්තය ගණනය කිරීමට පෙර රු.2,348,675 ක මුදලක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සංචිත අරමුදල් ප්‍රතිපාදනයට සාවද්‍යව මාරු කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා විස්තීර්ණ ආදායමට පසු ශුද්ධ අතිරික්තය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සංවර්ධන හා රක්ෂණ ශාඛාවල විස්තරාත්මක උපලේඛනයන්හි දැක්වෙන ආදායම හා වන්දි ගෙවීම් ප්‍රමාණයන් හා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රමාණයන් අතර පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයයන් | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | සංවර්ධන හා රක්ෂණ ශාඛාවල විස්තරාත්මක උපලේඛන අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| <u>ආදායම</u> | | | |
| කුඹුරු රක්ෂණය | 66,453,371 | 65,320,905 | 1,132,466 |
| පශු සම්පත් රක්ෂණය | 12,211,640 | 12,056,547 | 155,093 |
| සුව සෙත රක්ෂණය | 7,675,677 | 7,738,947 | 63,070 |
| ගොවි උපකරණ රක්ෂණය | 112,328 | 245,254 | 132,926 |
| අතිරේක භෝග රක්ෂණය | 32,709,977 | 34,241,112 | 1,531,135 |

**වන්දි ගෙවීම්**

| | | | |
|---|---|---|---|
| පශු සම්පත් | 4,396,137 | 4,351,215 | 44,922 |
| කුඹුරු | 39,674,693 | 49,475,159 | 9,800,466 |
| අතිරේක වගා | 23,895,125 | 15,174,165 | 8,720,960 |

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.1,625,688 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් දීර්ඝ කාලයක් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණි. තවද ඉන් රු.1,428,128 ක් හෙවත් සියයට 88 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 2010 සිට 2014 කාල පරිච්ඡේදය තුළ ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබාදෙන ලද රු.313,173,401 ක මුදලක් හා ඒ සඳහා පොලී 2014 දෙසැම්බර් 31 අවසානය දක්වාත් අදාළ අරමුදලින් අයකර ගෙන නොතිබුණි.

(ඇ) පුද්ගලික සමාගමකට ගෙවිය යුතු රු.1,176,333 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව 2010 වර්ෂයේ සිට ගිණුම්වල පැවතුණි.

(ඈ) රජයේ අමාත්‍යාංශ දෙකකට තාවකාලිකව මුදා හරින ලද සේවකයන්ගෙන් අයවිය යුතු රු.342,023 ක් වූ හිඟ වැටුප්, 2014 දෙසැම්බර් 31 වන විටත් මණ්ඩලය විසින් අයකර ගෙන නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.29,869,384 ක් වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ආදායම, ගෙවිය යුතු කොමිස් හා ලැබිය යුතු පශු සම්පත් පූර්ව වාරික වලට අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රලේඛය | පුරප්පාඩු තනතුරක වැඩ ආවරණය කිරීමේ රාජකාරි මාස 03 කට පමණක් සීමා විය යුතු වුවද, වැඩ ආවරණය කිරීම සඳහා පත්කරන ලද සේවකයන් 04 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානයට දිගු කාලයක් එම පුරප්පාඩු තනතුරුවල වැඩ ආවරණය කර තිබුණි. |
| (ආ) | <u>කළමනාකරණ සේවා චක්‍රලේඛ</u> | |
| i | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2009 ජූනි 01 දිනැති අංක 30(I) දරන චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව උසස්වීම් ලද සේවකයන්ට අදාළ වැටුප් පරිමාණ, උසස්වීම් නොලද සේවකයන් දෙදෙනෙකුට ගෙවා තිබුණි. |
| ii | 2009 සැප්තැම්බර් 09 දිනැති අංක 30(II) දරන චක්‍රලේඛය | වැටුප් පරිවර්තන සාවද්‍යව ගණනය කිරීම හේතුවෙන් සේවකයන් 07 දෙනෙකුට රු.151,610 ක වැඩිපුර ගෙවීමක් කර ඇති බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 25.38 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 81.32 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 107.30 ක වර්ධනයක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 25.72 කින් හා රු.මිලියන 98.35 කින් පිළිවෙලින් රක්ෂණ වාරික ආදායම වැඩිවීම හා වන්දි ගෙවීම් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

| විෂය | මිනුම | ඉලක්කය | | | | ඉටුකර ගැනීම | | | | ඉටුකර ගැනීම් ප්‍රතිශතයක් වශයෙන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | |
| | | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| | | | | රු.000 | රු.000 | | | රු.000 | රු.000 | % | % | % | % |
| 1. වගා රක්ෂණය | | | | | | | | | | | | | |
| (අ) වී | අක්කර | 88,424 | 81,825 | 90,107 | 90,740 | 49,108 | 50,851 | 57,386 | 65,321 | 55.54 | 62.15 | 63.69 | 71.99 |
| (ආ) වෙනත් භෝග | අක්කර | 54,708 | 24,000 | 44,165 | 48,165 | 11,899 | 16,500 | 24,770 | 34,241 | 21.75 | 68.96 | 56.09 | 71.09 |
| 2. පශු සම්පත් රක්ෂණය | සංඛ්‍යාව | 19,261 | 18,450 | 28,072 | 28,250 | 4,304 | 7,287 | 7,420 | 12,057 | 22.35 | 39.50 | 26.43 | 42.68 |
| 3. ගබඩා රක්ෂණය | සංඛ්‍යාව | 464 | 427 | 3,028 | 2,900 | 0 | 17 | 0 | 238 | 0.00 | 3.98 | 0.00 | 8.21 |
| 4. කෘෂි උපකරණ රක්ෂණය | සංඛ්‍යාව | 3,450 | 2,382 | 13,559 | 12,000 | 87 | 55 | 737 | 245 | 2.52 | 2.31 | 5.44 | 2.04 |
| 5. සුවසෙත හා ජීවිත රක්ෂණය | සංඛ්‍යාව | 50,659 | 50,300 | 31,613 | 29,935 | 2,252 | 11,289 | 1,369 | 7,739 | 4.45 | 22.44 | 4.33 | 25.85 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

පශු සම්පත්, ගබඩා, කෘෂි උපකරණ සහ සුවසෙත හා ජීවිත රක්ෂණය ආදී රක්ෂණ යෝජනා ක්‍රමවල භෞතික හා මූල්‍ය ඉලක්ක ඉටු කර ගැනීම අපේක්ෂිත ඉලක්ක සමඟ සැසඳීමේදී සියයට 50 කට වඩා අඩු වී තිබුණි.

### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර 2011 වර්ෂයේ හැර ඉකුත් වර්ෂ 5 ක හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය/ ඌනතාවය ක්‍රමයෙන් අඩුවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ආදායම | 124.6 | 109 | 139 | 175 | 128 | 114 |
| මුළු වියදම | 171.9 | 260 | 217 | 150 | 361 | 121 |
| රජයේ ප්‍රදානවලට පෙර අතිරික්තය / (ඌනතාවය ) | (47.3) | (151) | (78) | 25 | (233) | (7) |
| රජයේ ප්‍රදාන | 72.7 | 69 | 63 | 63 | 85 | 75 |
| රජයේ ප්‍රදානවලට පසු අතිරික්තය / (ඌනතාවය ) | 25.4 | (82) | (15) | 88 | (148) | 68 |

ඉහත තොරතුරු අනුව, මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහාය නොමැතිව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**රක්ෂණ යෝජනා ක්‍රම පරිපාලනය**

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා රක්ෂණ යෝජනා ක්‍රමවල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

**4.2 ව්‍යාපෘති ප්‍රමාදවීම**

ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් සංවර්ධනය කිරීම වෙනුවෙන් 2008 වර්ෂයේදී රු.585,800 ක වියදමක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය ප්‍රාග්ධන අත්තිකාරමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද ඉදි කිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 දක්වාත් ආරම්භ කර නොතිබුණි.

**4.3 වෙනත් ආයතනවලට අයත් වත්කම් අවිධිමත්ව යොදා ගැනීම**

මණ්ඩලය විසින් වෙනත් ආයතනවලට අයත් ජීප් රථ 2 ක් එම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් අවිධිමත්ව භාවිතා කර තිබුණි.

**4.4 මානව සම්පත් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධායක, විධායක නොවන හා කණිෂ්ඨ සේවක වර්ගයන්හි 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 125 ක් පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා මණ්ඩලය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ සහකාර තනතුරු 32 ක් පුරප්පාඩු පිරවීමෙන් තොරව පැවති නමුත්, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල අතිරික්ත සේවක සංඛ්‍යාව 34 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රධාන තනතුරු 12 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද එම තනතුරු දැන්වීම් මඟින් ප්‍රසිද්ධ කර, පිරවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

මණ්ඩලය විසින් රු.2,284,800 ක් වටිනා ගෘහස්ත ලිත් පිටපත් 500,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී මුද්‍රණය කර තිබුණි. කෙසේ වුවද රු.985,900 ක් වටිනා ඉන් පිටපත් 246,475 ක් බෙදා හැරීමෙන් තොරව 2015 පෙබරවාරි වන විටත් ගබඩාවේ තබා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(ආ) මෝටර් වාහන උපයෝජනය

(ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } FB/E/FPS/1/14/09    මගේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 05 November 2015

The Chairman,

Agricultural and Agrarian Insurance Board

**Report of the Auditor General on the Financial Statements of the Farmers' Pension and Social Security Benefit Scheme for the year ended 31 December 2014 in terms of Section 14(2)(c) of the Finance Act, No.38 of 1971.**

---

Reference to my letter of even number dated 18 September 2015 on the above subject.

02. The above mentioned report is sent here with.

W.P.C.Wickramaratne

Acting Auditor General

Copies to: 1. Secretary - Ministry of Finance.

2. Secretary - Ministry of Agriculture

මගේ අංකය / எனது இல. / My No. : එෆ්බී/ඊ/එෆ්පීඑස්/1/14/09

මබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2015 සැප්තැම්බර් 18 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2015 අගෝස්තු 07 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

යෝජනා ක්‍රමයේ සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 57,249 ක සෘණාත්මක විශ්‍රාම අරමුදල් ගිණුම් ශේෂයක් පැවතුණි. යෝජනා ක්‍රමයේ සාමාජිකයන්ගෙන් ප්‍රමාණවත් දායකයක් රැස්කර ගැනීම වෙනුවට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ හා ධීවර විශ්‍රාම වැටුප් හා ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පවත්නා වෙනත් අරමුදල්වලින් ණය ලබාගැනීම මඟින් විශ්‍රාම ගෙවීම් සිදුකිරීම හේතුවෙන් 2009 වර්ෂයේදී රු.මිලියන 663.8 ක් වූ ධන ශේෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයේ සිට එය සෘණ ශේෂයක් ලෙස අඛණ්ඩව වැඩිවී තිබුණි. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහායක් නොමැතිව යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව සැක සහිතය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක කාල පරිච්ඡේදය සඳහා යෝජනා ක්‍රමයේ අරමුදල් ගිණුමේ ශේෂය පහත දැක්වේ.

| වර්ෂය | වර්ෂය අවසානයට අරමුදල් ගිණුමේ ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 2014 | (57,249.4) |
| 2013 | (53,968.5) |
| 2012 | (48,945.1) |
| 2011 | (44,154.2) |
| 2010 | (40,536.7) |
| 2009 | 663.8 |

තවද යෝජනා ක්‍රමය මඟින් 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නිකුත් කරන ලද විශේෂ දැන්වීම යටතේ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබූ අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.මිලියන 1,954.8 ක රජයේ ප්‍රදානය යොදා ගනිමින් නව යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම් ලෙස රු.මිලියන 1,977.9 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද නව යෝජනා ක්‍රමයේ හඳුන්වා දෙන ලද නව දායකය පිළිබඳව 2014 වර්ෂය අවසානය දක්වා යෝජනා ක්‍රමය විසින් දායකයින් සමඟ සන්නිවේදනය කර නොතිබූ අතර නව යෝජනා ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂය තුළ එක් දායකයක් හෝ රැස්කර ගෙන නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර) අනුකූල නොවීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 07, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය විධිමත්ව වර්ගීකරණය කර නොතිබූ අතර ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේද දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා දෝෂ - පෙර වර්ෂ ගැලපීම්වලට අදාළ හෙළිදරව් කිරීම් විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 16, දේපල, පිරියත හා උපකරණ - දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ විස්තර විධිමත්ව හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 19, සේවක ප්‍රතිලාභ - විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී සිදුකර තිබූ අතර ඉන්පසු විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි. තවද නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යටතේ වගකීම ඉටුකිරීම සඳහා දායකය ආයෝජනය කර නොතිබුණු අතර විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලං ගි ප්‍ර 20, රජයේ ප්‍රදාන සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය හෙළිදරව් කිරීම - 1989 ට පෙර ආයතනයකින් ලැබී තිබුණු රු.547,885 ක්වූ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලං ගි ප්‍ර 24, සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් - සමාලෝචිත වර්ෂය තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කිහිපයක් සිදු වී තිබුණද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් කාර්යාලයේ බැංකු ගිණුමේ පැවති රු.472,878 ක බැංකු ශේෂයක් මුදල් හා මුදල් සමාන ශේෂ ලෙස දක්වනු වෙනුවට ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ආපසු ගෙවූ දායකය රු. 686,033 ක ගොවීන්ගේ දායකයට සාවද්‍යව හර කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ගොවීන්ගේ දායකය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු. 4,537,453 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලැබිය යුතු ආදායම් රු.574,696 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

**2.2.4** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.6,628,887 ක් වූ මුළු ලැබිය යුතු ආදායම් ශේෂයෙන් රු.2,111,110 ක් හෙවත් සියයට 30 ක් පමණක් අදාළ පාර්ශවයන් විසින් සනාථ කර තිබුණි.

(ආ) ගෙවිය යුතු විගණන ගාස්තු එකතුව රු.2,882,031 ක් 1997 වර්ෂයේ සිට නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී විශ්‍රාම වගකීම ගෙවීම සඳහා ලබාගත් කෙටි කාලීන ණය හා ඒ මත ගෙවිය යුතු පොලී රු.954,420,810 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කිරීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

(ඈ) ලැබිය යුතු ආදායම් රු.706,479 ක් 2006 වර්ෂයේ සිට අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

(ඉ) යෝජනා ක්‍රමය විසින් රු.මිලියන 1,978 ක මුදලක් 2014 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් මුදල් ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද 2012 හා 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු රු.මිලියන 3,033 ක් සමාලෝචිත වර්ෂයේදීද ගෙවා නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ III කොටසේ 20 වගන්තිය | නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකුගෙන් හා නම්කරන ලද සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත සාමාජිකයන් 12 දෙනෙකු උපදේශක කමිටුවට ඇතුළත් විය යුතු නමුත් 2014 වර්ෂය සඳහා සාමාජිකයන් 07 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඌ) | රෙගුලාසි විධිවිධානවලට පටහැනිව රැස්කිරීම් බැංකුගත කිරීමට සම්බන්ධවන හා චෙක්පත් ලියන හෝ මුදල් පොත පවත්වාගෙන යන නිලධාරියා විසින්ම බැංකු සැසඳුම් ප්‍රකාශනයද පිළියෙල කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 හා 881 | අදාළ නිලධාරීන් පත්වීම් ලද දිනයේ සිට මාස දෙකක් ඇතුළත ඇප ඉදිරිපත් කළ යුතු වුවද චෙක්පත් අත්සන් කරන සහ ආදායම එකතු කරන නිලධාරීන් විසින් 2014 වර්ෂය අවසානය දක්වාම ඇප ඉදිරිපත් කර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.3,281,960,985 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,022,289,687 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,740,328,702 ක හෙවත් සියයට 34.65 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොලී ආදායම හා ගොවීන්ගේ දායකය පිළිවෙලින් සියයට 5,067 කින් හා සියයට 40 කින් වැඩිවීම සහ ණය පොලී සහ දායකය ආපසු ගෙවීම පිළිවෙලින් සියයට 24 කින් හා සියයට 39.7 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන හේතූන් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ කැපීපෙනෙන තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| මුළු ආදායම | 150,295 | 40,104 | 61,148 | 115,434 | 170,898 |
| මුළු වියදම | (2,174,449) | (1,847,921) | (1,587,686) | (1,402,379) | (1,195,110) |
| විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | (3,285,970) | (3,288,353) | (3,216,991) | (3,059,459) | (2,938,033) |
| රජයේ ප්‍රදානයට පෙර වර්ෂය සඳහා ඌනතාවය | (5,310,124) | (5,096,170) | (4,743,529) | (4,346,404) | (3,962,245) |
| රජයේ ප්‍රදානය | 2,027,550 | 69,000 | 71,555 | 727,605 | 39,500 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය | 613 | 711 | 1,321 | 1,228 | 1,477 |
| රජයේ ප්‍රදානවලින් පසු ඌනතාවය | (3,281,961) | (5,021,459) | (4,670,653) | (3,617,571) | (3,921,268) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ ආදායම සියයට 77 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර එය 2014 වර්ෂයේදී සියයට 275 කින් වැඩි වී තිබුණි. එම කාල පරිච්ඡේදය තුළම මුළු වියදම සියයට 82 කින් වැඩිවී තිබුණි.

(ii) නියමිත කොන්දේසිවලට විශ්‍රාම වැටුප් බැරකම ඇතිකිරීම හා වියදම වැඩිවීම හේතුවෙන් 2010 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදානයට පෙර ඌනතාවය අඛණ්ඩව වැඩි වී තිබුණි.

(iii) 2010 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදානවලට පසු ඌනතාවය විශාල ලෙස වැඩි වී තිබූ අතර ලැබුණු රජයේ ප්‍රදානය වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී එය සියයට 35 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගෙන් රැස් කර ගන්නා ලද මුළු දායක මුදල් සහ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාල පරිච්ඡේදය තුළ විශ්‍රාම ගෙවීම් පහත දැක්වේ.

| වර්ෂය | දායක මුදල් | විශ්‍රාම ගෙවීම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2014 | 45.0 | 1,977.91 |
| 2013 | 32.1 | 1,646.98 |
| 2012 | 49.6 | 1,380.70 |
| 2011 | 97.6 | 1,226.70 |
| 2010 | 136.7 | 1,044.70 |

පසුගිය වර්ෂ 04 සඳහා විශ්‍රාම ගෙවීම් විශාල ලෙස වැඩිවී තිබුණි. මේ අතර පසුගිය වර්ෂ 04 සඳහා ලැබුණු දායකය ක්‍රමයෙන් අඩු වී තිබුණු අතර හිඟ මුදල් ගෙවීම හේතුවෙන් එය 2014 වර්ෂයේදී වැඩි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ එක් ගොවියෙකු හෝ යෝජනා ක්‍රමයට බඳවාගෙන නොතිබුණි.

(ආ) අයවැයගත ගොවීන්ගේ දායකය වූ රු.203,000,000 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබූ මුදල රු.53,6[illegible]1,560 හෙවත් සියයට 20 ක් පමණක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකත්වය අහිමි කිරීම හේතුවෙන් දායකයින් 71 දෙනෙකුට රු.667,373 ක මුදලක් ආපසු ගෙවා තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට ආයෝජන හා ඒ මත පොලී ආදායම සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර 2014 වර්ෂයේදී පහත දැක්වෙන පරිදි එය වැඩි වී තිබුණි.

| වර්ෂය | ආයෝජන | පොලී ආදායම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2014 | 199.6 | 96.6 |
| 2013 | 14.5 | 1.9 |
| 2012 | 12.4 | 2.7 |
| 2011 | 30.7 | 1.6 |
| 2010 | 3.5 | 14.9 |
| 2009 | 582.2 | 138.9 |

(ඉ) දිස්ත්‍රික් කාර්යාල 24 කින් හා උප කාර්යාල 2 කින් ලිපිගොනු 7,176 ක් විශ්‍රාම ගෙවීම පිළියෙල කිරීම සඳහා ලැබී තිබුණද, 2014 දෙසැම්බර් 18 දක්වා ලිපිගොනු 3,830 ක් හෙවත් සියයට 53 ක් සඳහා පමණක් ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර එම ලිපිගොනු විධිමත් ලියකියවිලි සහිත නොවීය.

**4.2 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

1992 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන රු.1,179,624 ක් වටිනා උපලබ්ධි නොවූ චෙක්පත් 117 ක් සම්බන්ධයෙන්, යෝජනා ක්‍රමය විධිමත් පියවර ගෙන නොතිබුණි.

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

යෝජනා ක්‍රමයේ දායකයන් පිළිබඳ පුද්ගලික ගිණුම් පරිගණක ගත කිරීම සඳහා 1990 වර්ෂයේ සිට රු.මිලියන 27.48 ක මුදලක් ගෙවා තිබුණද, එම ගිණුම් වර්ෂ 24 ක් ගත වීමෙන් පසුව 2014 දෙසැම්බර් 31 වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. තවද යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සඳහා දායකයන් සුදුසුකම් ලැබීම පිළිබඳව තීරණය කිරීම සඳහා යෝජනා ක්‍රමය විසින් ප්‍රමාණවත් තොරතුරු පවත්වා නොතිබුණි. එසේම දිස්ත්‍රික් කාර්යාල මගින් දායකයින්ගේ ගිණුම් විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් රු.2,791,679 ක් වටිනා චෙක්පත් 48 ක් සහ රු.7,152,249 ක් වටිනා බැංකු අණකර සාවද්‍යව පරිහරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබූ අතර මෙතෙක් එය නිරවුල් වී නොතිබුණි.

(ආ) සාවද්‍ය ලෙස රු.369,590 ක විශ්‍රාම මුදලක් පරිහරණය කරන ලද ක්ෂේත්‍ර නිලධාරියකුට එරෙහිව නඩුවක් ගොනු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඔහු සේවයෙන් පහකර තිබුණි. රු.100,000 ක මුදලක් පමණක් ඔහුගෙන් අයකර ගෙන තිබුණු අතර සේවකයාගේ මරණය හේතුවෙන් නඩුව ඉවත්කර ගෙන තිබූ බැවින් රු.269,590 ක ඉතිරි මුදල අයකර ගත නොහැකි වූ අතර 2014 දෙසැම්බර් 31 අවසානය දක්වා ගිණුම්වල මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන සඳහා රු.500,000 ක මුදලක් වෙන්කර තිබුණද, යෝජනා ක්‍රමය විසින් මෙම කාර්යය සඳහා රු.6,880,534 ක මුදලක් වැයකර තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු.6,769,568 ක් හෙවත් සියයට 6,100 ක වැඩිවීමක් එයින් දැක්වේ.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 – 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර තිබුණද, 2014 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් සහ වියදම් හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) දායක ගිණුම් පිළිබඳ පාලනය

(ඇ) විශ්‍රාම ගෙවීම්

(ඈ) අයවැය

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එෆ්බී/ඊ/එෆ්අයිඑස්එච් /01/14/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015 දෙසැම්බර් දින |

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

මාගේ සමාංක හා 2015 ඔක්තෝබර් 07 දිනැති ලිපියට යොමුවේ.

02. ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය

2. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එෆ්බී/ ඊ/එෆ්අයිඑස්එච /01/14/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015 ඔක්තෝබර් 07 දින |

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2015 ජූලි 22 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට යීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් වගකීම තක්සේරු කර යළි ස්ථාපිත කර තිබුණු අතර ඒ සඳහා කරන ලද රු.211,396,733 ක ප්‍රතිපාදන ඉකුත් වර්ෂ සඳහා මෙන්ම සමාලෝචිත වර්ෂයේ ආදායමට අයකර තිබුණි. එබැවින් අදාළ වර්ෂයන්හි මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි එය අයහපත් ලෙස බලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ ඍණාත්මක ශුද්ධ වත්කම තත්ත්වය රු.1,930,371,414 ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂයන් සඳහාද මෙම ප්‍රතිපාදනය වැඩිවීමට හැකියාවක් ඇති අතර එය යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රීලංගිප්‍ර)

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රීලංගිප්‍ර - 07, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - විශ්‍රාම වගකීම සඳහා වූ රු.211,396,733 ක ප්‍රතිපාදනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහ ලෙස දක්වනු වෙනුවට මූල්‍ය කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහ ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර - 19 , සේවක ප්‍රතිලාභ - 2007 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරී දායකයන් හා විශ්‍රාමලාභීන් සංඛ්‍යාව 54,248 සිට 30,735 දක්වා සියයට 40 කින් අඩුවී තිබූ අතර එම කාලය සඳහා වගකීම් වෙනුවෙන් ප්‍රතිපාදනය රු.මිලියන 1,242 සිට රු.මිලියන 2,556 දක්වා සියයට 100 කින් වැඩිවී තිබුණි. කෙසේ වුවද විශ්‍රාම වගකීම සඳහා ආයු ගණක තක්සේරුව සිදුකර තිබුණේ 2007 වර්ෂය සඳහා පමණි.

තවද ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයු ගණක තක්සේරුව හා ගිණුම් තැබීම සිදුකර තිබුණද, නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ අනාගත වගකීම පැවරීම වෙනුවෙන් යෝජනා ක්‍රමය විසින් දායක මුදල් ආයෝජනය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමකට අදාළව රු.332,401 ක් වූ බැංකු ශේෂය මුදල් හා මුදල් සමාන ශේෂ ලෙස දක්වනු වෙනුවට ලැබිය යුතු ආදායම් ලෙස හෙළිදරව් කර තිබුණි. එබැවින් මුදල් හා මුදල් සමාන ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු.110,610 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා ලබාදී තිබූ රු.මිලියන 646 ක (ණය සහ පොලී ) මුදලක් අයකර ගැනීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) එකතුව රු.1,159,250 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමෙන් තොරව 1998 වර්ෂයේ සිට ගිණුම්වල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

## 2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත | |
| (i) 20 වගන්තිය | උපදේශක කමිටුව නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද , 2014 වර්ෂය තුළදී සාමාජිකයන් 06 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ii) 26 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැරහැරි සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| (i) 9 පරිච්ඡේදයේ 9.7 ඡේදය | මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරීන් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.522,295 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය ප්‍රකාශන

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.7,170,305 ක ශුද්ධ පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.12,194,196 ක් වූයෙන් රු.19,364,501 කින් හෙවත් සියයට 159 කින් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් දැක්වුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.13,761,226 කින් හෙවත් සියයට 24 කින් මුළු ආදායම අඩුවීම සහ රු.5,603,275 කින් හෙවත් සියයට 13 කින් මුළු වියදම වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ අවධානයන් පහත වගුවේ දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | වෙනස්වීම වැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|
| | 2014 | 2013 | |
| | රු. | රු. | % |
| පොලී ආදායම | 38,533,361 | 52,346,551 | (26) |
| ධීවරයින්ගේ දායකය | 1,456,710 | 2,904,746 | (50) |
| පුනරාවර්තන වියදම සඳහා ප්‍රදාන | 3,000,000 | 1,500,000 | 100 |
| **මුළු ආදායම** | **42,990,071** | **56,751,297** | **(24)** |
| <u>අඩුකළා :- වියදම්</u> | | | |
| විශ්‍රාම ගෙවීම් | (41,867,619) | (37,367,889) | 12 |
| වෙනත් මෙහෙයුම් වියදම | (3,459,264) | (3,226,101) | 7 |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (4,833,493) | (3,963,111) | 22 |
| **මුළු වියදම්** | **(50,160,376)** | **(44,557,101)** | **13** |
| **වර්ෂය සඳහා ලාභය /(පාඩුව)** | **(7,170,305)** | **12,194,196** | **(159)** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය රු.1,456,710 ක් වුවද සමාලෝචිත වර්ෂය සඳහා මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.41,867,619 ක් විය. එබැවින් ලැබුණු දායකය ඉක්මවා විශ්‍රාම වැටුප් ගෙවීම සියයට 2,874 ක් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමස්ත ඌනතාවය රු.මිලියන 36.2 කින් වැඩිවීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ අරමුදල් ගිණුමේ ශේෂය රු.මිලියන 16.6 ක් හෙවත් සියයට 30 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 1,100 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද , බඳවා ගත් තථ්‍ය දායකයින් සංඛ්‍යාව 124 පමණක් වූ අතර සියයට 11 ක ඉටුකර ගැනීමක් පමණක් එයින් දැක්වුණි. දිස්ත්‍රික්ක 20 ක එක් දායකයෙක් හෝ බඳවා ගෙන නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයන්ගෙන් රු.2,720,000 ක දායක මුදල් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණද ලැබුණු තථ්‍ය දායක මුදල රු.559,988 ක් පමණක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දායකයින් 19,500 දෙනෙකුගෙන් ඉලක්කගත දෙවැනි සහ පසු වාරික එකතු කිරීම රු.2,925,000 ක් වුවද, දායකයින් 725 දෙනෙකුගෙන් තථ්‍ය එකතු කිරීම රු.551,836 ක් හෙවත් ඉලක්කයෙන් සියයට 19 ක් පමණක් විය.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සාමාජිකත්වය අහිමි කරන ලද දායකයින් හඳුනා ගැනීමට හා හිඟ වාරික ඔවුන්ගෙන් අයකර ගැනීමට යෝජනා ක්‍රමය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන විෂයයන්**

**පොලී ආදායම හඳුනා ගැනීම**

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබාදෙන ලද අරමුදල් මත පොලී ආදායම ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.37,570,605 ක මුදලක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද එම අරමුදල් මත පොලී ගෙවීම සම්බන්ධයෙන් මෙම යෝජනා ක්‍රම දෙක අතර කිසිඳු ගිවිසුමක් නොවීය. තවද මෙම පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 90 කින් නියෝජනය විය.

**5. ශිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

**5.1 අයවැය පාලනය**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) ධීවරයින්ට ප්‍රතිලාභ ගෙවීම

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් පිළිබඳ පාලනය

(ඈ) වාරික අයකර ගැනීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117 Subadrarama Rd, Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2014/4/5/මු/ර/2 ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ............ දිනය / திகதி / Date } 2015.08.12

විගණන අධිකාරි,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

කොළඹ.

<u>2014වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද14(2)(C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>

2014 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි

..........................

අධ්‍යක්ෂ ජනරාල්

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය


| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 ව්‍යාවනය කලමතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

(අ) ජංගම වත්කම් හා ජංගම වගකීම්ප්‍රමිතයේ දැක්වෙන පරිදි වර්ගීකරණය කර ඇත.

(ආ)රාජ්‍ය ප්‍රදාන මූල්‍ය කටයුතු වලින් ජනිත වූ අරමුදල් ප්‍රවාහයක් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පෙර වර්ෂයේ ගැලපුම් පිළිබඳ සටහනක් ඊලඟ ගිණුම් වර්ෂයේ සිට දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී පිරිවැය මත ගිණුම් ගත කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය බැවින් අදාල වත්කම් එම පදනම මත නිවැරදිව ගිණුම් ගත කර ඇත.

(ඉ) සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිත වගකීම් නිසි ආකාරයෙන් තක්සේරු කර ඇත. එයට අදාල ආයෝජනය මණ්ඩලයේ ආයෝජන තුලම පවති.

(ඊ) ගිණුම් ප්‍රමිතයට අනුව සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධයෙන් හෙලිදරව් කිරීම් ඊලඟ ගිණුම් වාර්තා තුල සටහනක් ලෙස හෙලිදරව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(එ) සේවක ණය ලැබිය යුතු ගිණුම් ශේෂයන් යටතේ මූල්‍ය වත්කමක් ලෙස ගිණුම් ගත කර ඇති අතර එයට අදාල ගිණුම් ප්‍රතිපත්තිය සටහන් අංක 2.4 යටතේ හෙලිදරව් කර ඇත.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු.**

(අ) අවසන් ගිණුම් පිලියෙල කරන දින දක්වා වාර්තා වූ, හඳුනා ගත හැකි වූ සියළු වියදම් උපචිත පදනම යටතේ ගිණුම් ගත කර ඇත. පසුව හඳුනා ගනු ලබන වියදම් 2015 වර්ෂය සඳහා ගිණුම් ගත කර ඇත.

(ආ) ආයෝජන උප ලේඛණයේ නිවැරදිව පොලි ගණනය කර ඇත. ඒ අනුව ඉදිරියේදීද එම තත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පාරිතෝෂිත වගකීම නිවැරදි ආකාරයට ගණනය කර ඇති අතර විගණනයේ දක්වා ඇති පරිදි අධි වෙන් කිරීමක් සිදු කර නොමැත.

(ඈ) මෙම මුදල මේවන විට ලැබී ඇති අතර මේ වන විට එම මුදල ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.

(ඉ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ලබා දුන් ණය මුදලේ පොලිය මරණ පාරිතෝෂිත අරමුදලේ පොලි ආදායම් තුල ගිණුම් ගත කර ඇත.

(ඊ) මෙහෙයුම් ලාභයෙන් 5% ක් AAIB සංචිත වෙනුවෙන් වෙන්කිරිම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන අතර එම ප්‍රතිපත්තියට අනුව නිසි පරිදි වෙන් කිරීම් සිදුකර ඇත.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

**(I)** අවසාන ගිණුම් තුල දක්වා ඇති රක්ෂණ ආදායම නිවැරදි වන අතර ඉදිරි වර්ෂය සඳහා ලද ආදායම වෙනුවෙන්ද ගැලපුම් කර ඇත. එහෙත් රක්ෂණ අංශය විසින් රක්ෂණ ආදායම ගණනය කිරීමේදී මුදල් පදනම යටතේ ගණනය කිරීම සිදු කරනු ලබයි. එබැවින් මුදල් අංශයේ දත්ත හා රක්ෂණ අංශයේ දත්තයන් සැසඳීම ප්‍රායෝගික නොවේ.

**(II)** අවසාන ගිණුම් පිලියෙල කිරීමේදී උපචිත පදනම මත රක්ෂණ වන්දි වියදම ගණනය කර ඇති අතර ඒ වෙනුවෙන් වෙන්කිරීම් කර ඇත. රක්ෂණ අංශය මඟින් රක්ෂණ වියදම් ලෙස දක්වා ඇත්තේ මුදල් පදනම මත ගණනය කරන ලද වියදම බැවින් මුදල් අංශයේ රක්ෂණ වියදම සංසන්සදනය කිරීම් ප්‍රායෝගික නොවේ.

### 2.2.4. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

**(අ)**ආපදා ණය රු.924738.22

2014.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.924738.22ක මුදලින් රු.140018.41ක මුදලක් අයකර ගෙන ඇති අතර, ශේෂය රු.784719.81කි. එන්තර වාසි නිකුත් කර තිබූ ණයකරුවන් අතරින් මෙම ණය ශේෂයට ඇතුලත් ණයකරුවන් තුන් දෙනෙකුගේ ලිපිනයන් වෙනස් කර ඇති බැවින්, ආපසු ලැබී තිබුණි. ඒ අනුව ඔවුන්ගේ දැනට පදිංචි ලිපිනයන් සොයා ගෙන මෙම ණයකරුවන් තිදෙනාද ඇතුළුව, ණයකරුවන් 7දෙනෙකු සඳහා නඩු පැවරීමට අවශ්‍ය කටයුතු දැනට සිදු කරමින් පවතී. මීට අදාළ ණය මුදල රු.432651.89කි. මියගිය ණයකරුවන් තිදෙනෙකුගේ පාරිතෝෂික මුදලින් අදාළ ණය මුදල් අය කර ගැනීම සඳහා ගැටළු පැන නැගී අතර, මේ සම්බන්ධව නැවත උරුමකරුවන් කැඳවා තීරණ ගැනීමට නියමිතය. එක් ණයකරුවකුගේ විනය පරීක්ෂණ වාර්තාව ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඔහුගෙන් අය විය යුතුව ඇති රු.91533.00ක මුදල පාරිතෝෂිකයෙන් අඩු කර ගැනීමට නියමිතය. 1982 වර්ෂයේ සිට 2000 වසර දක්වා වූ කාලපරිච්ඡේදයකට අදාළ ඉතිරි ණයකරුවන් 15දෙනෙකු සම්බන්ධයෙන් තොරතුරු සොයාගත නොහැකි බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ.

උත්සව අත්තිකාරම් රු.48750.00

මෙම ණයකරුවන්ට ලිපි හා එන්තරවාසි යවා ඇතත් කිසිදු පිලිතුරක් ලැබී නැත. ණයකරුවකුගේ ණය ප්‍රමාණය රු.4500 - රු.300/- යන පරාසය තුළ පවතින බැවින්, හා මේ සඳහා ඇපකරුවන් නොමැති බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයට නැවත වාර්තා කර තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. ණයකරුවන් 36කි.

විශේෂ අත්තිකාරම් රු.15050.00

එක් ණයකරුවෙකුගේ ණය අයකර ගෙන ඇත. මෙම ණයකරුවන්ටද ලිපි මඟින් දැනුම් දී ඇතත් ප්‍රතිචාර දක්වා නැත. ණයකරුවන් දෙදෙනෙකුට අපදා ණය සමඟ නඩු පැවරීමට නියමිතය. ඉතිරි ණයකරුවන්ට නැවත ලිපි යැවීමට කටයුතු කරන අතර, ප්‍රතිචාරයක් නොලැබුණහොත් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා යොමු කරනු ලැබේ. ණය ශේෂය රු.14150.00කි. ණයකරුවන් 15කි. ණය සීමාව රු.2000 - රු.300/- පරාසයේ ඇත.

යතුරුපැදි ණය රු.152102.50

ණයකරුවන් 07කි.මෙම ණය සඳහා ඇපකරුවන් සොයා ගැනීමේ ගැටළුවක් පවතී.තවද ණයකරුවන් දෙදෙනෙකු වැඩතහනම්ව ඇත. එක් අයෙකු මියගොස් ඇත. තුන්දෙනෙකු සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. ඉතිරි අයගේ ණය මුදල රු.1312.50 වන නිසා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා ඉදිරිපත් කරමි.

විශේෂ සේවක ණය රු.4800.00

ණයකරුවන් 4කි. එක් අයෙකු මියගොස් ඇත. ඉතිරි තිදෙනාට නැවත ලිපි යැවීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** ගොවි විශ්‍රාමවැටුප් අංශය වෙත ලබාදුන් ණය හා ඊට අදාළ පොළිය ක්‍රමිකව අය කර ගැනිමට කටයුතු කරනු ඇත.

**(ඇ)** මෙම මුදල් ක්‍රමිකව එම ආයතනය වෙත ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(ඈ)** අදාල වැටුප් ප්‍රතිපූර්ණය කරන ලෙස අදාල අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

### 2.2.5. විගණනයට ඉදිරිපත් නොකල සාක්ෂි

විගණන කටයුතු සඳහා ප්‍රමාණවත් සාක්ෂි ලැබී ඇත. ලැබිය යුතු වාරික ආදායම මේ වන විට ලැබී ඇති අතර කොමිස් ගෙවීම් නිසි පරිදි සිදු කර ඇත. පශු රක්ෂණ සඳහා ඉදිරියට ලැබීම් වෙනුවෙන් ප්‍රමාණවත් සාක්ෂි ලැබී ඇත.

### 2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

**(අ) ආයතන සංග්‍රහයේ 13.3 හි 11වන කොටස**

තනතුරු 12කට අදාලව පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පසුගිය වසරේ සැප්තැම්බර් මස ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවුවද ජනාධිපතිවරණය හේතුවෙන් හා කළමණාකාරීත්වය තීරණ මත ස්ථිර බඳවා ගැනීමේ තීරණ ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. මේ නිසා අදාළ තනතුරු වලින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 3 ක් රාජකාරි ඉටුකර ගැනීමේ පදනම මත පවත්වාගෙන යාමට සිදුව ඇත. අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් කළමණාකාරීත්වය විසින් එම අවස්ථාවේ දී තීරණයක් ගෙන තිබුන ද ඉහත සඳහන් හේතු මත ඉල්ලුම්පත් කැඳවා බඳවාගැනීම් ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. මේ නිසා දැනට එම තනතුරු වල රාජකාරි ආවරණය කරන නිලධාරීන් තවදුරටත් රාජකාරි ඉටුකිරිමේ පදනම මත තබාගැනීමට සිදුව ඇත. පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වීමෙන් පසු එලෙබෙන තත්වය තුල පත්වන අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයන් මත අදාළ තනතුරු සම්පූර්ණ කිරිමට කටයුතු කරනු ලැබේ.

**(ආ) (I) හා (II) 2006.09.22 දිනැති පරිපාලන සේවා චක්‍රලේඛ 30 හා 30(I) (II)**

වැටුප් වර්ධකවල පිහිටුවීමේ දි සිදුවී ඇතැයි පෙන්වා දී ඇති වැරදි සම්බන්ධව දැනට පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරිමේ ක්‍රියාවලිය තුල පරික්ෂා කර අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කරනු ලැබේ. මෙහි දි දැනට මතුවී ඇති ප්‍රධානතම ගැටළුව වී ඇත්තේ මෙම කාර්යය ඉටුකිරිම සඳහා පාලන අංශයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවත් නොසිටීමය. කෙසේ වුවද

දැනට එක් නිලධාරිනියක් විසින් එම කාර්යය ඉටු කරනු ලබන අතර, ක්‍රමාණුකූලව එම වැටුප් තල නිවැරදිව කිරීමට කටයුතු කරනු ලැබේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

### 3.1.2 මූල්‍ය තත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

රක්ෂණ යෝජනා ක්‍රම පරිපාලනය

### 4.2 ප්‍රමාද ව්‍යාපෘති

1973 වර්ෂයේ ආරම්භ කරන ලද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට මේ වන තෙක් ප්‍රධාන කාර්යාලයක් නොමැත. ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කර දෙන ලෙස ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් කල ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස රජමල්වත්ත පාර,බත්තරමුල්ලේ පිහිටි භූමියකින් හෙක්ටයාර් 0.502 න් යුත් ඉඩම් කොටසක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට පවරා දෙන ලදී. එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මූලික සබ්‍යතා වාර්ථාවක් ලබා ගැනීම වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ අධිකාරිය වෙත මෙම රු.585,800/-ක මුදල ලබා දී ඇත. එම වාර්ථා පදනම් කොට ගෙන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ව්‍යාපෘති වාර්ථාවක් පිළියෙල කර ඇති අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත එම වාර්තාව ඉදිරිපත් කර ඇත. 2011 වසරේ සිට මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මකව පවතින බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දැනට මුදල් අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම බාධාවක් ව පවතී.

දැනටද පෞද්ගලික ගොඩනැගිල්ලක කුළී පදනම මත ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යන බැවින්, ස්ථිර ගොඩනැගිල්ලකට කාර්යාලය රැගෙන යාමේ අවශ්‍යතාව තවදුරටත් පවතී. මේ නිසා බත්තරමුල්ලේ වෙන්කර ඇති ඉඩම තුළ ඉදිරියේදී අමාත්‍යාංශය හරහා මුදල් ප්‍රතිපාදන සපයා ගෙන ගොඩනැගිල්ලක්ඉදිකිරීමට බලාපොරොත්තු වේ. යම් හෙයකින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන්නේ නම් ගෙවා ඇති මුදල් ආපසු ලබා ගැනීමට ක්‍රියා කරනු ලැබේ.

### 4.3 භාවිතයට නොගන්නා වත්කම්

මේ වන විට අදාළ ජීප්රථ 7 න් බොලේරෝ වර්ගයේ ජීප් රථ 5ක් කෘෂිකර්ම අමාත්‍යාංශය පවරාගෙන ඇත. එක් ජීප් රියක් FAO ආයතනය පවරා ගැනිමට කටයුතු කරගෙන ඇත. ඉතිරි ජීප් රිය කෘෂි සංවර්ධන අධිකාරිය පවරාගෙන ඇති අතර එම ආයතනය දැනට ක්‍රියාත්මක නොවන බැවින් පවරා ගැනිම් ගැටළු මතු වී ඇත.

### 4.4 මානව සම්පත් කළමණාකරණය

(අ) 2009 වර්ෂයේ සකස් කල මානව සම්පත් සැලැස්ම මඟින් එවකට පැවති කාර්යභාරය හා කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද කලමණාකාරණ සහකාරවරුන් සංඛ්‍යාව පදනම් කර අවම වශයෙන් දිස්ත්‍රික් කාර්යාලයකට කළමණාකරණ

සහකාර වරුන් දෙදෙනෙකුවත් සිටිය යුතු යන පදනම මත වෙන්කිරීම් සිදුකර ඇත. එහෙත් විවිධ රෝගබාධ හා අපහසුතාවයන් සලකා බලා මෙන්ම දේශපාලන අධිකාරි නියෝගයන් මත අනුරාධපුරය, තඹුත්තේගම, මහනුවර, මාතලේ හා කෑගල්ල වැනි දිස්ත්‍රික් කාර්යාල වලට ස්ථාන මාරු ලැබූ සේවකයින් 20 දෙනාගේ අතිරික්තයක් වාර්තා වේ. මේ නිසා ප්‍රධාන කාර්යාලයේ අංශවල පුරප්පාඩු 30 වාර්තා වුවද මෙම අතිරික්ත සංඛ්‍යාව ප්‍රධාන කාර්යාලයේ සේවයට අනුයුක්ත කිරීම ගැටළුවක් ව පවතී. කෙසේ වුවද දැනට මණ්ඩලයේ කාර්යභාරය පුළුල්වීම මත දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් ඒ අනුව මානව සම්පත් සැලැස්ම සංශෝධනය කර කාර්ය මණ්ඩලය අළුතින් අනුමත කර ගැනිමට අපේක්ෂා කරනු ලැබේ.

**(ආ)** මෙම සේවකයින් බාහිර අමාත්‍යාංශ වලට තාවකාලික අනුයුක්ත කිරිමක් පමණක් කර ඇති හෙයින් ඔවුන් වෙනුවට බඳවා ගැනිම් සිදුකර නොහැකිව ඇත.

**(ඇ)** අදාළ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවුව ද මැතිවරණ ක්‍රියාවලිය හේතුවෙන් හා අළුතින් පත්වූ කළමණාකරීත්වය මේ සම්බන්ධව මේ වන තෙක් තීරණයක් ගෙන නොමැති බැවින් බඳවා ගැනීම් සිදු කල නොහැකිව පවතී.

## 4.5 <u>මතභේදයට තුඩු දුන් කරුණු</u>

2014 වර්ෂයේ අග භාගයේදී මුද්‍රණය කරන ලද ලිත් වලින් පෙන්වා දී ඇති ප්‍රමාණය ජනාධිපතිවරණය හේතුවෙන් බෙදාදීමට නොහැකිව ඉතිරිව තිබුනි. මෙම ලිත් 2015 වර්ෂයට අදාළ බැවින් ප්‍රචාරණ වැඩසටහන් වලදී බෙදා දීමට කටයුතු කර ඇත.

## 5. <u>වගවීම සහ යහ පාලනය</u>

## 5.1 <u>අයවැය ලේඛණමය පාලනය</u>

අයවැය ලේඛණය මණ්ඩලයේ යහ පාලනය සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත.

## 6. <u>පද්ධති සහ පාලනය</u>

ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්, වාහන උපයෝජනය අයවැය, පුද්ගල කළමණාකරණය යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd, Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2014/4/5/මු/ර/2 ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ............ දිනය / திகதி / Date } 2015.06.09

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

<u>2014වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද14(2)(C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>

2014 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි

..............................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571<br>011-2812572 | 011-5732397<br>011-2812574 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812573 | | |

**විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 ව්‍යාවනය කලමතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම.**

අංක 153/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරිමට කටයුතු කර ඇති අතර ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යාහැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමඟින් හඳුන්වාදෙන ලදි. අරමුදල් ශූන්‍ය වීම නිසා ගෙවීම් නවතා තිබූ ගොවි විශ්‍රාම වැටුප ද මේවන විට අඛණ්ඩව ගෙවීමට කටයුතු කරමින් පවතින අතර, 2014 අයවැය මඟින් යෝජනා කරන ලද රු.මි 1000 ක භාණ්ඩාගාර බැඳුම්කරය ද අරමුදල ශක්තිමත් කිරිම සඳහා ලබාදී ඇත. තවද 2015 අයවැය මඟින් රු.මි 2276 ක මුදලක් කෘෂි රක්ෂණ මණ්ඩලය වෙත වෙන් කර ඇති අතර, 2016,2017 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මි 2160 ක් හා රු. මි 2200 ක් ලබා දීමට පුරෝකථනය කර ඇත. එබැවින් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළුවක් ඉදිරියේ දි ඇති නොවේ.

**2.2.2 ගිණුම්කරන ප්‍රමිති හා නොඑකඟතාවන්**

**(අ)**මිලඟ ගිණුම් වර්ෂයේදී මුදල් ප්‍රවාහ වර්ගීකරණය නිවැරදිව කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** පෙර වර්ෂයේ ගැලපීම් වලට අදාල විස්තර ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** පූර්ණ වශයෙන් ක්ෂය කරන වත්කම්,වත්කම් රෙජිස්ටරය තුල පෙන්වා තිබුනද ගිණුම් වල හෙළිදරව් කර නොතිබුනු බැවින් ඉදිරි වර්ෂයේදී අදාල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඈ)** වර්තමානයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ඇති වූ තත්වය මත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අනුව විශ්‍රාම වැටුප් වගකීම නැවත තක්සේරු කිරීමට අපේක්ෂිතය.

**(ඉ)** ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 20ට අනුව රාජ්‍ය ප්‍රදාන නිසි අයුරින් ගිණුම් ගත කර ඇත.

**(ඊ)** මිලඟ ගිණුම් වර්ෂයේදී සම්බන්ධිත පාර්ශවයන්ට අදාල ගණුදෙණු නිසි අයුරින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ලැබිය යුතු ආදායමක් ලෙස පෙන්නුම් කර තිබූ මෙම ගිණුම් මුදල් හා මුදල් සමාන ශේෂයන් ලෙස ඉදිරිපත් කිරීමටඅවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) ශුද්ධ වාරික වියදම, ආදායම් ගිණුමට වැරදීමකින් හර වී ඇත. නමුත් ශුද්ධ ආදායමට බලපෑමක් වී නොමැත.

(ඇ) පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී ඉදිරියේ දී ඇති වන සම්භාවිතාවන්ද සැලකිල්ලට ගත යුතු වේ. රජය මඟින් ලබා දුන් රු.3000ක අන්තර් දීමනාව මූලික වැටුපට අනාගතයේ දී එකතු වන බව දක්වා තිබූ බැවින් පාරිතෝෂික වගකීම ගණනය කිරීම සඳහා මෙය අදාළ කර ගන්නා ලදී.

(ඈ) ශේෂ සහතික එවනු ලැබූ සියලු ආදායම් හා ගිණුම් වර්ෂයෙන් පසුව ලද පෙර වර්ෂයට අදාළ හඳුනා ගත හැකි සියලු ආදායම් හඳුනා ගෙන ගිණුම් ගත කර ඇත.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

(අ) ලැබිය යුතු වාරික මුදල් සඳහා ශේෂ සහතික එවන ලෙස සියලු ආයතනවලට දන්වන ලදි. ලැබිය යුතු ආදායම ලෙස ගිණුම් ගත කර ඇති සියලු මුදල් සඳහා ශේෂ සහතික නොතිබුනද එම වර්ෂයෙන් පසු එම මුදල් මණ්ඩලය වෙත ලැබී ඇත.

(ආ) විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට පියවර ගෙන ඇත.

(ඇ) මණ්ඩලයේ අනෙකුත් අරමුදල් මඟින් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමට ලබා ගෙන ඇති මුදල් ඉදිරියේදී විට පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ඈ) මෙම වර්ෂය තුල දී රු.10,000ක් අය කර ගැනීමට කටයුතු කල අතර ඉතිරි මුදල් අඛණ්ඩව අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේදී වැඩි ප්‍රතිලාභ ගොවියා වෙත ලැබෙන බැවින් මෙම මුදල් ඒ සඳහා හිලව් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.3 නීති ,රීති ,රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම

(අ) උපදේශක කාරක සභා සාමාජිකයින්ගේ නිළ කාලය අවසන් වීමෙන් පසු ඒ සඳහා නැවත සාමාජිකයින් පත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් මඟින් අදාල ආයතන වෙත දැනුම් දී ඇත.එසේ උපදේශක කාරක සභාවට සාමාජිකයින් පත් නොකල ආයතන වෙත ඒ පිලිබඳව දැනුම් දීමට පියවර ගෙන ඇත.

(ආ)(i)මුදල් අංශයේ සේවක පුරප්පාඩු පවතින බැවින් අදාල බඳවා ගැනීම් සිදු කිරීමෙන් පසු වැඩ බෙදී යන ආකාරයට රාජකාරී පැවරීමට කටයුතු කරනු ලැබේ. එසේ වුවද ගිණුම් නිලධාරීවරයාගේ පූර්ණ අධීක්ෂණය හා පරීක්ෂාවට මුදල් පොත් හා බැංකු සැසඳුම් ලක්වේ.

(ii) අදාල මුදල් රෙගුලාසි අදාල රාජ්‍ය දෙපාර්තුමේන්තු සේවකයන් සඳහා අදාල වන අතර මණ්ඩලය වෙත අදාල වන්නේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා තීරණ වේ.

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

**3.2 <u>මූල්‍ය තත්වය පිලිබඳ විග්‍රහත්මක සමාලෝචනය</u>**

(අ) (i) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය නොකිරීම නිසා 2010 සිට 2014 දක්වා ආදායම අඩු වී ඇති අතර, වයස අවු 60 සම්පූර්ණ කිරීම නිසා විශාල පිරිසක් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලැබීම නිසාත් තවත් කොටසක් යෝජනා ක්‍රමයට එකතු වීම නිසා වියදම ක්‍රමිකව වැඩි වී ඇත.

(ii) ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි හෙලිදරව් කිරීම් සිදු කරන ලද අතර ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇත. වාර්ෂිකව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම වැඩිවීම නිසා ඌනතාවයද ක්‍රමිකව වැඩි වී ඇත.

(iii) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම සඳහා රාජ්‍ය ප්‍රතිපාදන ලබා දීම සඳහා සැලසුම් කර ඇත. ඒ අනුව ඉදිරි වර්ෂ තුන තුල රු. මිලියන 5000 ක භාණ්ඩාගාර බැඳුම්කර ලබා දීම සඳහා 2015 අයවැය මඟින් යෝජනා කර ඇත.

**4 <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**4.1 <u>කාර්යසාධනය</u>**

(අ) 2010 අගෝස්තු මාසයේ සිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වීමෙන් පසු තව දුරටත් යෝජනා ක්‍රමයට දායක කිරීමෙන් යෝජනා ක්‍රමයේ වගකීම් ප්‍රමාණය වැඩිවීම තුල මූල්‍ය අර්බුදය තවදුරටත් වර්ධනය වන බැවින් 2010 අගෝස්තු මාසයේ සිට යෝජනා ක්‍රමයට ගොවීන් දායක කරවීම අත්හිටුවන ලදි.

ඒ අනුව මෙම යෝජනා ක්‍රමයේ ක්‍රියාත්මකභාවය සම්බන්ධයෙන් ස්ථිර විසඳුමකට එලඹෙන තෙක් 2013 වර්ෂයේදීද කිසිදු දායක කර ගැනීමක් නොකල බැවින් දායක වාරික අඩු වී ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා දායකයන් විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලැබීම නිසා විශ්‍රාම වැටුප වැඩි වී ඇත.

(ආ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් බඳවා ගැනීම සිදු නොකිරීම නිසා පසු වාරික අය වීම පහත වැටී ඇත.

(ඇ) පනත අනුව යෝජනා ක්‍රමයෙන් ඉවත් වන දායකයන් සඳහා ගෙවීම් සිදු කර ඇත. ඔවුන් ගෙවූ වාරික හා පොලිය ගෙවීම සිදු කර ඇත.

(ඇ) යෝජනා ක්‍රමය සතු ආයෝජන විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදා ගැනීම නිසා මණ්ඩලයේ ආයෝජන හා ආයෝජන ආදායම 2013 වර්ෂය දක්වා ක්‍රමිකව අඩු වී ඇත.

(ඊ) 2014 දෙසැම්බර් දක්වා ගෙවීම් සඳහා යොමු කලප්‍රමාණයෙන් ඉතිරි ප්‍රමාණය විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ඇති පිරිස සඳහා මේ වන විට ගෙවීම් කර අවසන් කොට ඇත.

## 4.2 බැංකු ගිණුම් ක්‍රියාවලියේ අඩුපාඩු

(අ) වසර 20 කට වඩා පැරණි මෙම උපලබ්දි නොවූ චෙක්පත් ගිණුම් වලින් ලියා හැරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

## 4.3 කලමනාකරණ දුර්වලතා

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 26 ක් ක්‍රියාත්මක වේ.වර්තමානය වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයින් 950,000 /- ක් දායක වී ඇත.වසර 22 ක් පුරා පරිගණක ගත කිරීමේ කාර්යය සිදු කර ගෙන යාමේදී විවිධ අවස්ථා වල පැවති තාක්ෂණික පිරිවිතරයන්ට අනුව පරිගණක යන්ත්‍ර හා මෘදුකාංග මිලදී ගෙන අවශ්‍යතාවය අනුව යොදවා ගනු ලැබුවද ධාරිතාවය වැඩිවීම හේතුවෙන් හා අවශ්‍යතා මට්ටම වෙනස් වීම හේතුවෙන් නව තාක්ෂණයට ගැලපෙන අයුරින් තොරතුරු යාවත්කාලීන කර ගැනීමේ අවශ්‍යතාවය ඇතිවූ නිසා මෙම වියදම දැරීමට සිදුවී ඇත. වර්තමානය වන විට කොළඹ විශ්ව විද්‍යාලය සමග එක්වී වැඩි ධාරිතාවයකින් යුතු පරිගණක පද්ධතියක් ස්ථාපනය කොට ධාරිතාවයට සරිලන මෘදුකාංග ද නිර්මාණය කර ඇත.එම පරිගණක මෘදුකාංග පද්ධතියෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය දත්තයන් පද්ධතියට ඇතුලත් කරමින් පවතින අතර දායකත්වය පිළිබද සියලුම තොරතුරු ලබාගත හැකි තත්වයට අවසන් කර ඇත.වසර 22 ක් පුරා ක්‍රියාත්මක වූ යෝජනා ක්‍රමයේ 950,000 ට අධික දායකයින් බැඳී ඇති අවස්ථාවක වසරකට දෙවරක් බැගින් වාරික මුදල ගෙවනු ලැබ ඇති විට පසු වාරික මිලියන ගණනාවක් පරිගණක ගත කිරීමේ ගැටලුව පමණක් පැන නැගී ඇත.

## 4.4මතභේදයට තුඩු දෙන කරුණු

(අ) මාවිල් ආරු සිදුවීමෙන් හානි සිදු වූ ගොවීන්ට වන්දි ගෙවීමේදී සිදු වී ඇති මෙම ගැටලුකාරී සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

(ආ) මෙම වාර මුදල් වංචාවට සම්බන්ධ ක්ෂේත්‍ර නිළධාරි සුසිල් ප්‍රේමරත්න මහතා වැඩ තහනම්ව සිටි අතර ඔහුට විරුද්ධව HC/5/2009 අංක දරණ නඩුව අනුරාධපුර මහාධිකරණයේ විභාගයට ගැනේ. ඔහු රු.100,000/- ක මුදලක් පමණක් මණ්ඩලයට ගෙවා තිබියදි මියගොස් ඇත.මේ හේතුව නිසා ඔහුට විරුද්ධව තවදුරටත් නීතිමය

වශයෙන් කටයුතු කල නොහැකි බැවින් අදාල නඩු වාර්ථා ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව දන්වමි.

**(ඇ)** 2012/2013 වර්ෂවල දී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු නොකල අතර 2014 වර්ෂයේ දී නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව මණ්ඩලය ගොවි විශ්‍රාම වැටුප් නොගෙවීම නිසා මණ්ඩලය ගැන තිබූ අයහපත් ආකල්පය ඉවත් කරමින් මණ්ඩලයේ කටයුතු පිළිබඳ පුළුල් ප්‍රචාරයක් හා ජන ප්‍රසාදයක් ලැබෙන ආකාරයට දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙහිදී ප්‍රාදේශිය ගොවි විශ්‍රාම වැටුප් බෙදා දීමේ රැස්වීම් 100 කට වඩා පවත්වන ලද අතර ගොවීන් 113,011 ජනවාරි මාසය වෙනුවෙන් ගෙවීම් සිදු කරන ලදී. මේ අනුව එක් ගොවියෙකු වෙනුවෙන් දරා ඇත්තේ රු. 60කට ආසන්න මුදලකි

## .5 වගවීම සහ යහ පාලනය

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

නවතා තිබූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කර ගෙවීම් කිරීම සඳහා වැඩි අවධාණයක් යොමු කල අතර දැනට යෝජනා ක්‍රමයේ දායක වී ඇති ගොවීන්ගේ සක්‍රියභාවය පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇත. ගොවීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාකාරි සැලැස්මක් 2014 වර්ෂයේදී පිළියෙල නොකරන ලදි.

### 5.2 අයවැය ලේඛණමය පාලනය

යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කරමින් තිබූ නිසා අයවැය මඟින් බලාපොරොත්තු වූ ඉලක්ක වෙත ලඟා වීමට නොහැකි වී ඇත.

## 6. පද්ධති සහ පාලනය

ගිණුම්කරණය, දායක ගිණුම් පාලනය,විශ්‍රාම වැටුප් ගෙවීම, අයවැය, ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරිමට අවශ්‍ය කටයුතු කිරිමට අපේක්ෂිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷண / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2014/4/5/මු /ඩී /2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ..........
දිනය / திகதி / Date } 2015.06.24

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

<u>2014 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2)(C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>

2014 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..........
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

පණ්ඩුක වීරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය
අංක 117, සුභද්‍රාරාම පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත වගකීම ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර ඇත. මෙම යෝජනා ක්‍රමය මූල්‍ය සක්‍යතාවයක් නොමැති රාජ්‍ය සහනාධාරය මත පදනම් වූ යෝජනා ක්‍රමයක් බැවින් මෙලෙස අනාගත වගකීම ඉහල ගොස් ඇත. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයද ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

**2.2.2 ගිණුම්කරණ ප්‍රමිති හා නොඑකඟතාවයන්**

(අ) මීලඟ ගිණුම් වර්ෂයේදී අදාල මුදල් ප්‍රවාහය මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්ප්‍රවාහයක් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිලිබඳ ආයු ගණක තක්සේරුවක් සිදු කර ඇති අතර එය පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර ඇත. ඉදිරියේදී ආයු ගණක තක්සේරුකරුවකු ලවා නැවතත් වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ධීවර අමාත්‍යංශයට අයත් දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් මෙම ගිණුම් පවත්වාගෙන යනු ලබයි. ප්‍රධාන කාර්යාලයේ රැස් කිරීමේ ගිණුමට ලබා දීම ප්‍රමාද වී ඇති දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් රැස් කරන ලද වාරිකයන් එම කාර්යාල මඟින් ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම් ගත කර ඇත. එම නිසා මණ්ඩලයේ ජංගම වත්කම් වල වෙනසක් සිදු වී නොමැත.

(ආ) මණ්ඩලය පාරිතෝෂිත වෙන් කිරීම නිවැරදි ආකාරයට සිදු කර ඇත.

### 2.2.4 <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්</u>

**(අ)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ඇති වූ මූල්‍ය අර්බුදය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදී තීරණය වූ පරිදි ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත මෙම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබා දී ඇත. මෙම ණය මුදල ක්‍රමිකව පියවීමට අපේක්ෂිතය.

**(ආ)** විගණන ගාස්තු ඉදිරියේදී ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.6 <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම</u>

**(අ)** **(i)** ධීවර උපදේශක කාරක සභා සාමාජිකයින්ගේ නිල කාලය අවසන් වීමෙන් පසු ඒ සඳහා නැවත සාමාජිකයින් පත් කිරීම සඳහා මුදල් අමාත්‍යංශයේ ලේකම් මඟින් අදාල ආයතන වෙත දැනුම් දී ඇත. එසේ උපදේශක කාරක සභාවට සාමාජිකයින් පත් නොකල ආයතන වෙත ඒ පිළිබඳව දැනුම් දීමට පියවර ගෙන ඇත.

**(ii)** අඛණ්ඩව වාරික 5 ක් ගෙවීම සිදු නොකලහොත් ධීවරයන්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී පූර්ව දැනුම් දීමක් සිදු කර ඇත. අවලංගු වූ දායකයන් සඳහා ඔවුන්ගේ වයස අවු. 60 සම්පූර්ණ වූ පසු ඔවුන් මණ්ඩලය වෙත ගෙවන ලද මුදල් හා පොලිය ආපසු ගෙවනු ලබන අතර ධීවර දෙපාර්තුමේන්තුවේ සහකාර දිස්ත්‍රික් කාර්යාල මඟින් එසේ යොමු කරන ලද අවලංගු වූ දායකයන් හට මේ වසර තුලදීද මුදල් හා පොලි ආපසු ගෙවීම් සිදු කර ඇත.

**(ආ)** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතට අනුව සේවය කරන මණ්ඩලීය නිළධාරීන් වෙත ධීවර අමාත්‍යංශයට අයත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අතිරේක වැඩ කොටසක් පැවරී ඇත. ඒ අනුව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මෙම මණ්ඩලීය කාර්යභාරය වෙනුවෙන් වෙනමම කාර්ය මණ්ඩලයක් අනුමත නොවීම හේතුවෙන් මෙම වැඩ ආවරණය කිරීම වෙනුවෙන් මෙම දීමනා ගෙවනු ලැබේ. එය 1991 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප ආරම්භ කල දිනයේ සිට ගෙවා ඇත.

මෙම ගෙවීම් සඳහා පහත සඳහන් අනුමැතීන් ලැබී ඇත.

- ධීවර විශ්‍රාම වැටුප් උපදේශන කාරක සභා අනුමැතිය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය.
- විෂය භාර අමාත්‍ය රාජ්‍ය ලේකම්ගේ අනුමැතිය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

### 3.2 මූල්‍ය තත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ),(ආ),(ඇ),(ඈ)**

මෙම යෝජනා ක්‍රමය ධීවර අමාත්‍යාංශය හා ධීවර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ක්‍රියාත්මක කරන අතර කෘෂිරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වන්නේ යෝජනාක්‍රමය පරිපාලනය හා ගිණුම් තබා ගැනීම වේ. කාර්යසාධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාරේතමේන්තුව විසිනි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

යෝජනා ක්‍රමයේ අවලංගු වු දායකයින් පිළිබද තොරතුරු ධීවර අමාත්‍යංශය වෙත යොමු කොට ඇති අතර ඔවුන්ගේ හිඟ වාරික අය කිරිම හා දායකත්වයේ රදවා තැබීම සම්බන්ධයෙන්ද ධීවර අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව ඉදිරියේදි කටයුතු කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 4.3 පොලි ආදායම හඳුනා ගැනීම

ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෙදූ මුදල එම යෝජනා ක්‍රමයට ලබා දුන් ණය මුදලක් ලෙස සලකා කටයුතු කල බැවින් එම පොළී ගැලපීම් සිදු කර ඇත. ඉදිරියේදී මෙම ණය හා පොලි ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.

## 5. වගවීම සහ යහ පාලනය

### 5.1 අයවැය ලේඛණමය පාලනය

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත බැවින් බඳවා ගැනීම් දිරිමත් නොකිරීම නිසා මෙම තත්වය උද්ගත වී ඇත.

## 6. පද්ධති සහ පාලනය

ගිණුම්කරණය, ධීවරයින් සඳහා ප්‍රතිලාභ ලබාදිම, අයවැය,ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්, පසු වාරික මුදල් අය කර ගැනිම යන කරුනු කෙරෙහි මේ වන විට දැඩි අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදි තව දුරටත් විශේෂ අවධානය යොමු කිරිමට අපේක්ෂිතය.